2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

(03) අභිධර්මය

ලකුණු බෙදී යාම

I කොටසේ ප්‍රශ්නය ද, II කොටසෙන් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

i සිට ii දක්වා ලකුණු 2 බැගින් 2×2 = 4යි

iii සිට x දක්වා ලකුණු 3 බැගින් 3×8 = 24යි

I කොටසට නියමිත මුලු ලකුණු - 28යි

II කොටස

ප්‍රශ්න අංක 1 සිට ප්‍රශ්න අංක 7 දක්වා

(i)	(අ) කොටස	(ලකුණු 02 යි)
	(ආ) කොටස	(ලකුණු 03 යි)
(ii)	කොටස	(ලකුණු 06 යි)
(iii)	කොටස	(ලකුණු 07 යි)
		(ලකුණු 18 යි)

I කොටසට ලකුණු 28යි

II කොටස ලකුණු 72යි

මුළු ලකුණු 100යි

Past Papers Wiki

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

1.

(i)
- ධම්මසංගණිප්පකරණ
- විභංගප්පකරණ
- පුද්ගලපඤ්ඤත්තිප්පකරණ
- ධාතු කථාප්පකරණ
- කථාවත්ථුප්පකරණ
- යමකප්පකරණ
- පට්ඨානප්පකරණ

යන ග්‍රන්ථ හතෙන් කවර හෝ දෙකක් නම් කිරීමට

(ලකුණු 02යි)

(ii)
- බුදු රජාණන්වහන්සේ තාවතිංස දෙව් ලොව දී මාතෘ දිව්‍ය රාජයාට දේශනා කිරීම
- බුදු රජාණන්වහන්සේ සාරිපුත්ත මහ රහතන් වහන්සේට දේශනා කිරීම

(ලකුණු 02යි)

(iii)

කාම භූමි	54
රූප භූමි	15
අරූප භූමි	12
ලෝකෝත්තර භූමි	08 හෝ 40

නම් කිරීමට ලකුණු 01යි
සංඛ්‍යා දැක්වීමට ලකුණු 02යි } **(ලකුණු 03යි)**

(iv) උපේක්ඛා සහගත උද්ධච්ච සම්පයුක්ත සිත **(ලකුණු 01යි)**

උපේක්ෂාව සහිත නොසන්සුන් බවින් යුක්ත වූ (කැළඹුණු බවින් යුක්ත) සිත

(ලකුණු 02යි)

(v) ආකාසානඤ්චායතනය **(ලකුණු 01යි)**

අනන්ත ආකාශය අරමුණු කොට උපදවා ගන්නා ධ්‍යානය **(ලකුණු 02යි)**

(vi) අලෝභ, අදෝෂ, අමෝහ, ලෝභ, දෝෂ, මෝහ යන කුසල හෝ අකුසල මූලයන් සමඟ නොයෙදෙන නිසා හෙවත් එම මූලයන් හේතු වශයෙන් නොයෙදෙන නිසා.

(ලකුණු 03යි)

(vii) **උද්ධච්ච කුක්කුච්ච** **(ලකුණු 01 යි)**

සිතේ විසිරුණු, කැළඹිලි සහිත බව හා කළ අකුසල් හා නොකළ කුසල් පිළිබඳව සිතේ විසිරුණු ස්වභාවය උද්ධච්චය ලෙස ද; පසුතැවීම කුක්කුච්චය ලෙස ද හැඳින්වේ.

(ලකුණු 02යි)

(viii) **සබ්බචිත්ත සාධාරණ චෛතසිකයක් වූ "ඒකග්ගතාව"** **(ලකුණු 01යි)**

- ❖ නීවරණ ධර්මයන් විශ්කම්භන වශයෙන් යටපත් කිරීම
- ❖ සිතේ එකඟබවක් ඒකාග්‍රතාවක් - සමාධියක් ඇති කිරීම
- ❖ පංච අභිඥා වැනි සුවිශේෂී ඥාණ ලබා ගැනීමට පාදක වීම
- ❖ ප්‍රතිසන්ධි විපාක වශයෙන් බ්‍රහ්ම ලෝකයේ උපත ලබා දීම
- ❖ ප්‍රවෘත්ති විපාක වශයෙන් බ්‍රහ්ම සුවය ලබා දීම

කවර හෝ කාර්යයන් දෙකක් ලියා තිබේ නම් **(ලකුණු 02යි)**

(ix) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව **(ලකුණු 01යි)**

ආජීව අෂ්ටමක සීලය **(ලකුණු 02යි)**

(x) පංචස්කන්ධය ශේෂව පවතිද්දී සිත තුළ අනුසය වශයෙන් පැවති ක්ලේෂයන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කිරීමෙන් නිවන අවබෝධ කර ගැනීම.

(ලකුණු 03යි)

II කොටස

1.

(i) **සූත්‍ර පිටකය** - විසි එක් දහසක් ධර්මස්කන්ධය ඇතුළත් සූත්‍ර දේශනා, නිකාය ග්‍රන්ථ පහ

විනය පිටකය - විසි එක් දහසක් ධර්මස්කන්ධය ඇතුළත් විනය දේශනාව, විනය ප්‍රඥප්ති

අභිධර්ම පිටකය - දෙසාළිස් දහසක් ධර්මස්කන්ධය ඇතුළත් සතර පරමාර්ථ ධර්ම

(නම් කිරීමට ලකුණු 02යි)

(විෂය පථය දැක්වීමට ලකුණු 03යි)

PAST PAPERS WIKI

(ii) සූත්‍ර පිටකයේ දී සත්ත්වයා හා ලෝකය පිළිබඳ ව දක්වන්නේ ස්කන්ධ පංචකය (පංචඋපාදානස්කන්ධය) දොළොස් ආයතන හා අටළොස් ධාතු වශයෙනි. පුද්ගලයා හා ලෝකය පිළිබඳ මෙම විග්‍රහයෙන් අනාත්ම බව තහවුරු කෙරේ. අභිධර්මයේ දී ධර්ම විශ්ලේෂණය හා සංස්ලේෂණය කර ඇති ආකාරය සූත්‍ර පිටකයට වඩා පැහැදිලි හා නිරවශේෂ විභේදනයක් වේ. සූත්‍ර පිටකයේ දැක්වෙන මෙම බෙදීම ලෝකය හා සත්ත්වයා පිළිබඳ සම්පූර්ණ වර්ගීකරණයක් ද නොවේ.

(මේ කරුණු ඇසුරෙන් ලියා ඇති පිළිතුරට ලකුණු 06යි)

(iii) නිප්පරියාය දේශනාව ලෙස හඳුන්වන්නේ අභිධර්ම පිටකයයි. සප්පරියාය දේශනා ලෙස සූත්‍ර පිටකය හැඳින්වේ. මේ ආකාරයට හැඳින්වීමට හේතුව එම පිටක දෙක ධර්ම කරුණු ඉදිරිපත් කරන ආකාරයේ ඇති මූලික වෙනස. සූත්‍ර පිටකයේදී ධර්ම කරුණු ඉදිරිපත් කරන්නේ උපමා උපමේය භාවිතයෙන්, කථා පුවත් නිදර්ශන ලෙස දැක්වීමෙන්, පැහැදිලි කිරීම්වල දී ජන කාන්ත සන්නිවේදන මාර්ග උපයෝගී කර ගැනීමෙනි. අභිධර්ම පිටකයේදී උපමා උපමේය හා ජන කාන්ත සන්නිවේදන මාර්ග වෙනුවට නිශ්චිත වූද සංක්ෂිප්ත වූද ශාස්ත්‍රීයවූ ද විලාසයකින් කරුණු ඉදිරිපත් කරයි. පාරිභාෂික පද භාවිතය, අභිධර්ම පිටකයට සුවිශේෂී වේ. සූත්‍ර පිටකයේදී පාරිභාෂික පද භාවිතය වෙනුවට පරියාය පද භාවිතා කෙරේ.

(මේ කරුණු අනුව සන්සන්දනාත්මකව කළ පැහැදිලි කිරීමට ලකුණු 07යි)

2.

(i) (අ) අහේතුක අකුසල විපාක සිත් 07යි
අහේතුක කුසල විපාක සිත් 08යි
අහේතුක ක්‍රියා සිත් සිත් 03යි

(ලකුණු 02යි)

(ආ) ඇසත් එයට අරමුණු වන රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදී.

(ලකුණු 03යි)

(ii) අහේතුක ක්‍රියා සිතක් වූ උපේක්ඛා සහගත පංචද්වාරාවජ්ජන සිත යනු ඇස කණ ආදී පසිඳුරන්ට කවර හෝ අරමුණක් ගැටුණු විට එහෙත් හවාංගය පැවති සිත විඩින් කවර දොරටුවකින් අරමුණ පැමිණියේ ද යන්න විමසා බැලීම. එම සිතින් කෙරෙන කාර්යයි. අනුසය වශයෙන් පැවති සිතුවිලි ක්‍රියාකාරී ඒවාට පාඨන් ගනී. එය හඳුන්වන්නේ පරියුට්ඨාන අවස්ථාව වශයෙනි.

(ලකුණු 03යි)

මනෝද්වාරාවජ්ජන සිත යනු මනසට ලැබෙන අරමුණු ආවර්ජනය කිරීමයි. හෙවත් කල්පනා කිරීමයි.

(ලකුණු 03යි)

(iii) කුසල අකුසල විපාක සිත් හේතුවෙන් පුද්ගලයාට සසර පුරා දුක සැප දෙකම විඳීමට හේතු වේ. කුසල විපාක වශයෙන් සැප ද අකුසල විපාක වශයෙන් දුක ද ප්‍රවෘත්ති විපාක වශයෙන් විඳීමට සිදු වේ. කුසල විපාක සිත් ප්‍රබල වන්නේ නම් ඇතැම් විට අකුසල විපාක දීම ප්‍රමාද විය හැකිය. අකුසල ප්‍රබල නම් කුසල විපාක දීම පමා විය හැකිය. මේ හැර උපස්ථම්භක, උපපීඩක කර්ම නිසා කුසල් අකුසල් විපාක දීම වෙනස්විය හැකිය. උපස්තම්භක කර්ම කුසලයට රුකුල් දෙන අතර අකුසල විපාක ලබා දීමේදී එයට ද රුකුල් දෙයි. උපපීඩක කර්ම නිසා කුසලයට බාධා වේ. කුසල විපාක උපපීඩක කර්ම අකුසලයට බාධා වේ.

(මේ කරුණු ඇසුරින් කළ විමසීමට ලකුණු 07යි)

3.

(i) (අ) සබ්බචිත්ත සාධාරණ චෛතසික 07

ප්‍රකිර්ණක චෛතසික 06

(ලකුණු 02යි)

(ආ) විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද **(ලකුණු 03යි)**

(ii) **අහිරික** - මෝහ චතුෂ්කයට අයත් දෙවැනි අකුසල චෛතසිකයයි. කාය දුශ්චරිත වචී දුශ්චරිත පිළිකුල් නොකරන ස්වභාවයයි. අත්තාධිපත්‍ය වශයෙන් සිතමින් පාපය පිළිකුල් නොකරන ස්වභාවය නිසා ලැජ්ජාවෙන් තොරව අකුසල් කරයි.

(ලකුණු 03යි)

අනොත්තප්ප - මෙයට මෝහ චතුෂ්කයට අයත් තෙවැනි අකුසල චෛතසිකයයි. කාය දුශ්චරිත වචී දුශ්චරිතාදියට බිය නොවන ස්වභාවය. ලෝකාධිපත්‍ය වශයෙන් සිතා නීතියට සමාජයට බිය නොවී පාපයට ඇලෙන ස්වභාවය ඇතිවන්නේ මේ පවට බිය නොවීම හේතුවෙනි. මේ චෛතසික දෙක සියලු අකුසල් සිත්හී ම යෙදෙන බැවින් අකුසල සාධාරණ චෛතසික දෙකක් ලෙස ද හැඳින්වේ.

(ලකුණු 03යි)

(iii) අහිරිකය (පාපයට ලැජ්ජා නොවීම) අනොත්තප්පය (පාපයට බිය නොවීම) හේතුවෙන් පුද්ගලයා කවර අවස්ථාවක වුව ද කවර සමාජයක වුව ද තමා ගැන හෝ අන්‍යයන් ගැන හෝ නොසිතා ඕනෑම අකුසලයක් කිරීමට පෙළඹෙයි. එබඳු පුද්ගලයෝ සමාජය තුළ දැක ගැනීමට ඕනෑ තරම් සිටිති. මේ චෛතසික දෙක අකුසල සාධාරණ බැවින් කවර තරමේ වුව ද අකුසලයක් ඕනෑම අවස්ථාවක ලැජ්ජාවකින් හෝ බියකින් තොරව සිදුකිරීමට එම පුද්ගලයා පෙළඹෙයි. එහි ප්‍රතිඵලය වන්නේ එම අකුසල කර්ම හේතුවෙන් ප්‍රතිසන්ධි විපාක වශයෙන් හෝ ප්‍රවෘත්ති විපාක වශයෙන් සසරදී ලබන බියකරු දුකට පත්වීමයි. සතර අපායට වැටීමයි. දුක්මුසු ජීවිත ලැබීමයි.

(මේ කරුණු ඇසුරෙන් ලියා ඇති පැහැදිලි කිරීමට ලකුණු 07යි)

Past Papers Wiki

4.

(i) **(අ)** කර්මය, චේතනාව මුල් වීමෙන් සිදුවන්නකි. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි - කායේන වාචාය මනසා" එය කයින් වචනයෙන් හා සිතින් සිදු කෙරේ. කිසියම් කුසල් හෝ අකුසල් කටයුත්තක් කිරීමට අවශ්‍ය සියලුම අවශ්‍යතා එකක් හෝ අඩුවීමෙන් සිදුකළහොත් එය කර්මයක් බවට පත්වේ. කර්ම පථය යනු එම අවශ්‍යතා කිසිවක් අඩුනොවී සම්පූර්ණ වී ක්‍රියාව සිදුකළහොත් එය කර්ම පථයක් බවට පත්වේ.

(ලකුණු 02යි)

(ආ) කර්මයකින් ලැබෙන විපාක ප්‍රවෘත්ති විපාක පමණි. ප්‍රතිසන්ධි විපාක ලබා දීමට තරම් කර්මය ප්‍රබල නොවේ. කර්ම පථයකින් ලැබෙන විපාක දෙවර්ගයකි. ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාක වශයෙන් ඒවා ප්‍රභේදගතය. ප්‍රතිසන්ධි විපාක යනු උපතක් ලබා දීමට සමත් කර්මයන්ය. ප්‍රවෘත්ති විපාක යනු උපත ලැබූ තැන් පටන් මරණයට පත්වන තුරු ජීවිතය පුරා සසර පුරා අත්විඳීමට සිදුවන විපාකයන්ය. ඒවා කර්මවලින් හා කර්ම පථවලින් දෙකෙන්ම ලැබේ. ප්‍රතිසන්ධි විපාක ලැබෙනුයේ කර්ම පථවලින් පමණි. ඒ අනුව කර්මයට වඩා කර්ම පථය ප්‍රබලය.

(ලකුණු 03යි)

(ii)

- ❖ මිච්ඡාදිට්ඨිය ඇත්තවුන් ආශ්‍රය කිරීම
- ❖ ධර්මයෙන් ඈත්ව වාසය කිරීම
- ❖ අයෝනිසෝ මනසිකාරයෙන් යථාර්ථය නොදැකීම
- ❖ නොමනා වැරදි කල්පනා බහුල වීම
- ❖ ද්විහේතුක ප්‍රතිසන්ධියෙකු වීම

යන කරුණු පදනම් කරගනිමින් හේතු පැහැදිලි කර තිබිය යුතු ය.

(ලකුණු 06යි)

(iii) "දෝෂය" යන අකුසල මූලය හේතුවෙන් හටගන්නා සිත් දෙකකි. ඒවා දෝෂ මූලික සිත් යනුවෙන් හැඳින්වේ.

දොමනස්ස සහගත පටිඝ සම්පයුක්ත අසංඛාරික සිත
දොමනස්ස සහගත පටිඝ සම්පයුක්ත සසංඛාරික සිත

ඉන්ද්‍රිය ගෝචර වන්නා වූ අරමුණ අමනාප අප්‍රිය අරමුණක් වීම නිසා "දෝෂ" චෛතසිකය පරියුට්ඨාන වී - සිත තුළ ක්‍රියාත්මක වේ. ඒ සමඟම ඇතිවන ක්‍රියාකාරකම් හා වචන පටිඝයෙන්, කෝපයෙන් යුක්ත වේ. ඒ නිසාම පුද්ගල සන්තානය පිරිහීමට පත් වේ. රුධිර ගමනාගමනය වෙනස් වේ. එම චෛතසිකය වීතික්කම වූ විට හෙවත් ශරීරය

තුළින් ක්‍රියාත්මක වන විට එය සමාජයේ අන්‍යයන්ට ද පීඩනයක් ගෙන දේ. අතින් පයින් පහරදීම, භාණ්ඩ විනාශ කිරීම, වචනයෙන් පරුෂ ලෙස බැන වැදීම ආදිය සිදුකරන විට එය සමාජ අහිතකර ප්‍රතිඵල අන්‍යයන් කෙරේ ඇති කරයි. මේ කරුණු ඇසුරෙන් පුද්ගලයා ආධ්‍යාත්මිකව හා සමාජමය වශයෙන් පිරිහීමට පත්වන ආකාරය පෙන්වාදීම උදාහරණ සහිතව කළ යුතුය.

(ලකුණු 07යි)

5.

(i) (අ)

- අතිමහන්තාරම්මණ
- මහන්තාරම්මණ
- පරිත්තාරම්මණ
- අතිපරිත්තාරම්මණ

(ලකුණු 02යි)

(ආ) චක්ඛුද්වාරික අතිමහන්තාරම්මණ චිත්තවීථි සටහන

	1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17	
භ	ති	න	ද	පං	ච	ඝං	ණ	ඨෝ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ

(ලකුණු 03යි)

(ii) **සන්තීරණ කෘත්‍යය** - චක්ඛුවිඤ්ඤාණයන්ගෙන් අරමුණ පිළි ගැනීම සම්පටිච්ඡන සිතින් කෙරෙන අතර, එම අරමුණ පිළිබඳව තීරණය කරනු ලබන්නේ මේ සන්තීරණ සිතිනි. ඒ සඳහා උපයෝගී වන්නේ අහේතුක සිත් අටළොස අතරින් උපේක්ඛා සහගත අකුසල විපාක සන්තීරණ සිත, කුසල විපාක උපේක්ඛා සහගත සන්තීරණ සිත හා සෝමනස්ස සහගත කුසල විපාක සන්තීරණ සිත යන සිත් තුන පමණි. වෙනත් කිසිදු සිතක් සන්තීරණ කාර්යය නොකරයි.

(ලකුණු 03යි)

තදාරම්මණ කෘත්‍ය - චිත්තවීථි සටහනෙහි අවසාන අවස්ථා දෙකයි. තදාරම්මණ අවස්ථා දෙක පිහිටන්නේ අතිමහන්තාරම්මණ චිත්තවීථියක පමණි. තදාරම්මණ අවස්ථා දෙකක් මිස එකක් ඇති නොවේ. එම නිසාම එම චිත්තවීථිය තදාරම්මණ චිත්තවීථිය ලෙස ද හැඳින්වේ. තදාරම්මණ කෘත්‍ය සඳහා යෙදෙන්නේ අහේතුක සන්තීරණ සිත් තුන සහ මහා කුසල විපාක සිත් අට යන සිත් එකොළොසින් එකකි.

(ලකුණු 03යි)

(iii) අතිමහන්තාරම්මණ චිත්තවීථියක පවත්නා වැදගත් ම ලක්ෂණ එක් අතීත භවාංගයකින් පසුව භවාංග චලනය වීම, චිත්තවීථියේ 9 වැනි අවස්ථාවෙන්ම ජවන්සිත් ආරම්භවීම තදාරම්මණ අවස්ථා දෙකක් පැවතීම

(මෙයින් කවර හෝ පිළිතුරු දෙකක් සඳහා ලකුණු 02යි)

අතිමහන්තාරම්මණ චිත්තවීථියක් ඇතිවීමට බලපාන සාධක -

- ❖ ඉතා පැහැදිලි අරමුණක් : ඉන්ද්‍රිය ගෝචර වීම
- ❖ ඉන්ද්‍රියන් : ප්‍රසාද වස්තුව, නිරෝගීව පැවතීම
- ❖ ගෝචර වූ අරමුණ පිළිබඳ දැඩි අවධානය හා මනසිකාරය යි.

(යන කරුණු ඇසුරෙන් උදාහරණ සහිතව කළ පැහැදිලි කිරීමට ලකුණු 05යි)

6.

(i) (අ) "සංඛත" යන්නෙහි අර්ථය හේතු ප්‍රත්‍ය සමවායයෙන් හටගත් බවයි. සංඛාර යනු ද සංඛත යන්න ම පරියාය වශයෙන් හැඳින්වීමකි.

(ලකුණු 02යි)

(ආ) **තීණිමානි භික්ඛවේ සංඛතස්ස සංඛත ලක්ඛණානි, කතමානි තීණි උප්පාදෝ පඤ්ඤායති, වයෝ පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤත්ථං පඤ්ඤායති.** යන පාඨය හෝ එහි සරල අදහස සිංහලෙන් හෝ ලියා තිබීම වැදගත්.

(ලකුණු 03යි)

(ii) **"අවිජ්ජා පච්චයා සංඛාරා"** යන පාඨයේ සරල අදහස - අවිද්‍යාව හේතුවෙන් සංඛාර හටගන්නා බවයි. මෙහි සංඛාර යනු - පුඤ්ඤාභි සංඛාර අපුඤ්ඤාභි සංඛාර - ආනෙඤ්ජාභි සංඛාර යන කුසල අකුසලයන්ය. මේවා චාතුරාර්ය සත්‍ය නොදැනීම නිසා රැස් වේ.

(මේ කරුණු ඇසුරෙන් කරනු ලබන පැහැදිලි කිරීමට ලකුණු 06යි)

(iii) ලෝකයේ පවත්නා යථාර්ථය චාතුරාර්ය සත්‍ය තුළින් පැහැදිලි කෙරෙන අතර සංඛාරයන්ගේ ලක්ෂණය වන්නේ අනිත්‍ය බව දුක් බව හා අනාත්ම බවය. අපට පාලනය කළ නොහැකි වසඟයට ගත නොහැකි තත්ත්වයකි. ලෝකයේ සියල්ල අනිත්‍ය නම් දුක් සහගත නම් අනාත්ම නම් එබඳු දේ කෙරෙහි තණ්හාවෙන් බැඳී, එහි ම වෙලී කටයුතු කිරීමට මිනිසා නොපෙළඹේ. ඒ අනුව පුද්ගලයා යහපත් දිවි පෙවෙතකට හුරු වේ. අනුගමනය කරයි. එමෙන්ම නිවන පරමාර්ථය කරගෙන දිවි ගෙවන පුද්ගලයා අකුසලය හැකි සෑම විටම බැහැර කිරීමට උනන්දු වේ.

(මේ කරුණු ඇසුරෙන් ලියා ඇති පිළිතුරට ලකුණු 07යි)

7.

(i) (අ) ප්‍රඥාව සහිත පුද්ගලයා සීලයක පිහිටා සිත සමාධිගත කරගැනීමත් ප්‍රඥාවන් වඩා ගැනීමත් සිදු කරයි. මෙයින් අර්ථවත් කරන්නේ සීල සමාධි ප්‍රඥා යන ආර්ය මාර්ගය නුවණැත්තා විසින් සපුරාගන්නා බවය.

(ලකුණු 02යි)

(ආ) **"කාය වාචානං සමෝධානං සීලං"** කය වචන දෙකේ සංවර භාවය සීලයයි.

(ලකුණු 03යි)

(ii) බුදු රාජාණන් වහන්සේ අනුදැන වදාළ ආර්ය මාර්ගය සීල සමාධි ප්‍රඥා වශයෙන් අනුපූර්ව ශික්ෂාවෙන් යුක්ත වේ. මේ පියවර තුන ම ක්‍රමානුකූලව වර්ධනය කර ගැනීම නිවනට හේතු වේ. සීලයක පිහිටා සමාධියත් සීල සමාධි දෙකම මත පිහිටා ලෝකෝත්තර ප්‍රඥාවත් වර්ධනය කළ යුතු ය.

මේ කරුණු ඇසුරෙන් අදහස සනාථ කිරීම, උදාහරණ දැක්වීම කළ යුතු ය.

(ලකුණු 06යි)

(iii) සතර සතිපට්ඨානයේ සිවුවැන්නයි. නීවරණ පබ්බය. ඛන්ධ පබ්බය, ආයතන පබ්බය, බොජ්ඣංග පබ්බය, චතුසච්ච පබ්බය යන සාධක ඇසුරෙන් ධම්මානුපස්සනා සතිපට්ඨානය පිළිබඳ විස්තරය කළ යුතු ය.

(ලකුණු 07යි)

****

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ට ප්‍රයෝජනය සඳහා පමණි.

47830

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

(03) අභිධර්මය

S 3

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු සමග අමුණා භාරදෙන්න.

ඊ. ඩී. විදානපතිරණ
විභාග අංකය

I කොටස

1. (i) අභිධර්ම පිටකය 'නිප්පරියාය දේසනා' යනුවෙන් හැඳින්වීමට හේතුව දක්වන්න. *(ලකුණු 02 යි)*

.....

.....

(ii) අටුවාචාරී බුද්ධඝෝෂ හිමියන් අභිධර්මය දැනගැනීමේ ඇති වැදගත්කම පෙන්වාදුන් ආකාරය දක්වන්න. *(ලකුණු 02 යි)*

.....

.....

.....

(iii) සර්වාස්තිවාදී අභිධර්මයේ අසංඛත ධර්ම තුනක් දක්වයි. එම අසංඛත ධර්ම තුන නම් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(iv) සිත් පහළවන සතරවැදෑරුම් භූමි නම් කර, ඒ ඒ භූමිවල පහළවන සිත් සංඛ්‍යාව දක්වන්න. *(ලකුණු 03 යි)*

.....

.....

.....

.....

(v) දොළොස් අකුසල් සිත් මූලික කොටස් තුනකට බෙදේ. එම කොටස් තුන නම් කර, ඒ ඒ කොටස්වලට අයත් සිත් සංඛ්‍යාව දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(vi) දොළොස් අකුසල් සිත්හි අවිශේෂයෙන් යෙදෙන චෛතසික පිළිවෙළින් නම් කර, ඒවා හඳුන්වන නම් ද ලියන්න. *(ලකුණු 03 යි)*

.....

.....

[දෙවැනි පිටුව බලන්න.

(vii) ලෝකෝත්තර පළමු කුසල් සිත ලියන්න. එම සිතින් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කරන සංයෝජන නම් කරන්න. *(ලකුණු 03 යි)*

.....

.....

.....

.....

(viii) අප්පමඤ්ඤා චෛතසික නම් කරන්න. එයින් එකක් හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

.....

.....

.....

(ix) විඤ්ඤත්ති රූප නම් කරන්න. එයින් කෙරෙන කාර්යය දක්වන්න. *(ලකුණු 03 යි)*

.....

.....

.....

.....

(x) නිවන් පසක් කිරීමේ දී උපකාරී වන ඤාණ විශේෂ තුනක් ලෙස ත්‍රිවිද්‍යා හැඳින්වේ. එම ත්‍රිවිද්‍යා ඤාණ නම් කර එක් එක් ඤාණයෙන් කෙරෙන කාර්යය දක්වන්න. *(ලකුණු 03 යි)*

.....

.....

.....

.....

.....

.....

**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

47830

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

S 3

(03) අභිධර්මය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) "අභිධම්මේ ද්වේ නිදානානි. අධිගම නිදානං දේසනා නිදානං" යන පාළි පාඨයේ සරල සිංහල අර්ථය දක්වමින් අභිධර්මයේ ආරම්භය හා විකාශය පිළිබඳව විස්තර කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ථෙරිය විභජ්ජවාදීන්ගේ අභිධර්ම සම්ප්‍රදාය පිළිබඳ ව විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ධම්මසංගණිප්පකරණය හා පුග්ගලපඤ්ඤත්තිප්පකරණය පිළිබඳව වෙන් වෙන් ව හැඳින්වීම් කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) බුදු සමයෙහි 'ධර්ම' යන වචනයෙන් නිරූපිත අර්ථ විභාග කරන්න. *(ලකුණු 04 යි)*

(ii) සංස්කරණය වූ හටගත් කවර දෙයක් වුවත් සංඛත ධර්ම ලෙස හැඳින්වේ. සාකච්ඡා කරන්න *(ලකුණු 06 යි)*

(iii) අසංඛත ධර්ම යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 08 යි)*

4. (i) (අ) දෝෂ මූලික අකුසල සිත් දෙක ලියන්න.

(ආ) එම සිත් දෙකේ චෙතස්කම පෙන්වා දෙන්න. *(ලකුණු 04 යි)*

(ii) එම සිත්වල ඇතුළත් 'දෝමනස්ස' 'පටිඝ' 'සසංඛාරික' යන ලක්ෂණ පිළිබඳව උදාහරණ සහිතව හැඳින්වීම් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "දෝෂ චෛතසිකය වීතික්කම වීම තුළින් පුද්ගලයා අධ්‍යාත්මිකව හා සමාජමය වශයෙන් පරිහානියට පත්වේ." විමසන්න. *(ලකුණු 08 යි)*

5. (i) චිත්ත සහ චෛතසික අතර පවත්නා සිවුවැදෑරුම් සම්බන්ධතාව පෙන්වා දෙන්න. *(ලකුණු 04 යි)*

(ii) චෛතසික වර්ගීකරණය කෙරෙන මූලික ප්‍රභේද නම් කර, ඉන් එකක් හඳුන්වන්න. එම එක් එක් ප්‍රභේදයන්ට අයත් චෛතසික සංඛ්‍යාව දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) සියලු ම සිත් සමඟ අනිවාර්යයෙන් ම යෙදෙන චෛතසික නම් කර, එම එක් එක් චෛතසිකය මඟින් කෙරෙන කාර්යය පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

6. (i) ඝානද්වාරික අතිමහන්තාරම්මණ චිත්ත වීථි සටහන අඳින්න. *(ලකුණු 04 යි)*

(ii) අතිමහන්තාරම්මණ චිත්ත වීථියක පවත්නා මූලික ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) පංචද්වාරික චිත්තවීථි හා මනෝද්වාරික චිත්තවීථි පිළිබඳ ව මූලික ප්‍රභේද ඇතුළත් වන සේ විස්තරයක් කරන්න. *(ලකුණු 08 යි)*

7. (i) "සීලේ පතිට්ඨාය සීලං නිස්සාය චත්තාරෝ සතිපට්ඨානේ භාවෙය්‍යාථ" යන පාඨයේ සරල අදහස ලියා චාරිත්‍ර සීලය, වාරිත්‍ර සීලය පිළිබඳව හැඳින්වීම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) සීලය පිළිබඳ නිර්වචනය දක්වා ආර්ය මාර්ගය අනුගමනය කිරීමේ දී සීලයේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) සතර සතිපට්ඨානය පිළිවෙළින් නම් කරන්න. එයින් පළමුවැන්න පිළිබඳව විස්තරයක් කරන්න. *(ලකුණු 08 යි)*

PAST PAPERS WIKI

[හතරවැනි පිටුව බලන්න.

8. (i) නිවන අවබෝධ කර ගැනීම පිණිස අනුගමනය කරන ආර්යමාර්ගයේ සතර ආකාර වූ පියවර පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) එම දෙවැනි, තෙවැනි, සිව්වැනි පියවර මඟින් සංයෝජන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කරන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) 'නිර්වාණය' යන්න අර්ථකථනය කර, සෝපදිශේෂ නිබ්බාණ හා අනුපදිශේෂ නිබ්බාණ පිළිබඳව ලක්ෂණ දක්වමින් සංසන්දනාත්මක විස්තරයක් කරන්න. *(ලකුණු 08 යි)*

* * *

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

(03) අභිධර්මය

ලකුණු බෙදීයාම

- I වන කොටසේ ප්‍රශ්නය ද II කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුවේ.

I කොටස.

1. ප්‍රශ්නය

i. සිට ii දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 04 බැගින්.

iii. සිට x දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 03 බැගින්.

(ලකුණු 28යි.)

II කොටස.

2. ප්‍රශ්නය සිට 8. ප්‍රශ්නය දක්වා

i. කොටස සඳහා ලකුණු 04යි.

ii. කොටස සඳහා ලකුණු 06යි.

iii. කොටස සඳහා ලකුණු 08යි.

(ලකුණු 18යි.)

❖ I කොටසට ලකුණු	28
❖ II කොටසට ලකුණු 4 x 18	72

මුළු ලකුණු (28+72=100යි.)

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

1.

i. හුදු ශාස්ත්‍රීය හා නිශ්චිත විලාසයකින් හා පාරිභාෂික පද භාවිතයෙන් කරුණු ඉදිරිපත් කරන නිසා.

(ලකුණු 02යි.)

ii. අභිධර්මය නොදත් තැනැත්තා ධර්ම දේශනා කරන විට මෙය ස්වවාදයය මෙය පරවාදය යන නිරවුල් අවබෝධයක් නැති හෙයින් දහම් කරුණු පටලවා දේශනා කිරීම.

(ලකුණු 02යි.)

iii.

(අ) ප්‍රතිසංඛ්‍යා නිරෝධය.

(ආ) අප්‍රතිසංඛ්‍යා නිරෝධය.

(ඉ) ආකාස

(ලකුණු 03යි.)

iv. කාම භූමි 54 රූප භූමි ~~12~~ 15

අරූප භූමි ~~15~~ 12 ලෝකෝතර භූමි 08/40

(භූමි නම් කිරීමට ලකුණු 02යි. සිත් සංඛ්‍යාව දැක්වීමට ලකුණු 01)

(ලකුණු 03යි.)

v.

(අ) ලෝභ සිත් 08

(ආ) දෝෂ සිත් 02

(ඉ) මෝහ සිත් 02

(සිත් නම් කිරීමට ලකුණු 02යි. සිත් සංඛ්‍යාවට ලකුණු 01)

(ලකුණු 03යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බංද්ධ ධර්මාධ්‍යාපන විභාගය\ලකුණු දීමේ පටිපාටි\(03) අභිධර්මය.docx

vi. මෝහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච

මෝහ චතුෂ්කය.

(චෛතසික හතර පිළිවෙළින් නම් කිරීමට ලකුණු 02යි. නම් කිරීමට ලකුණු 01යි.)

(ලකුණු 03යි.)

vii. සෝතාපත්ති මග්ග චිත්තය (සෝවාන් මාර්ග සිත)

(අ) සක්කාය දිට්ඨි

(ආ) විචිකිච්චා

(ඉ) සීලබ්බත පරාමාස

(සිත් නම් කිරීමට ලකුණු 01යි. සංයෝජන නම් කිරීමට ලකුණු 02යි.)

(ලකුණු 03යි.)

viii.

(අ) කරුණා (ආ) මුදිතා

කරුණා

අනුන්ගේ දුකේදී ඇතිවන කම්පාවීම හා ඒ දුකින් මුදවා ගැනීමේ කැමැත්ත හා ඒ සඳහා ක්‍රියාත්මක වීම.

මුදිතා

අනුන්ගේ දියුණුව, සම්පත් ලැබීම දැක තමන්ට වඩා ඔවුන් දියුණුවනු දැක සිතෙහි ඇති කරගන්නා සතුට.

(චෛතසික දෙක නම් කිරීමට ලකුණු 02යි. එකක් හැඳින්වීමට ලකුණු 01යි.)

(ලකුණු 03යි.)

ix.

(අ) **කාය විඤ්ඤත්ති**

සිත නිසා පැවැති වායෝ ධාතුව හා එක්ව හටගන්නා වූ ශරීරය ක්‍රියා කරවීමේ, සෙලවීමේ, හැසිරවීමේ හැකියාව.

(ආ) **වචී විඤ්ඤත්ති**

චිත්තජ වායෝ ධාතුව උපකාරයෙන් උගුර හා මුඛය උපකාර කරගෙන ශබ්ද නිපදවමින් අන් අයට තම අදහස ප්‍රකාශ කිරීමේ ස්වභාවය.

(රූප නම් කිරීමට ලකුණු 01යි. රූප දෙක හැඳින්වීමට ලකුණු 02)

(ලකුණු 03යි.)

PAST PAPERS WIKI

x.

(අ) **පුබ්බේනිවාසානුස්සති ඤාණය**

පෙර ආත්ම භවයන්හි ඉපිද සිටි ආකාරය පිළිබඳව තොරතුරු සිහිපත් කිරීමේ ඤාණය.

(ආ) **චුතූපපාතඤාණය**

සත්වයාගේ චුතිය හා උප්පත්තිය දැන ගැනීමේ ඤාණය

(ඉ) **ආසවක්ඛයඤාණය**

කෙලෙස් හෙවත් ආශ්‍රවයන් දුරු කිරීමේ ඤාණය

(ඤාණ තුන නම් කිරීමට ලකුණු 01යි. එම ඤාණවල කාර්ය දැක්වීමට ලකුණු 02)

(ලකුණු 03යි.)

II කොටස

2.

i. අභිධර්මයට නිදාන දෙකකි. අධිගම නිදාන හා දේශනා නිදාන වශයෙනි.

(ලකුණු 01යි.)

අභිධර්මයේ ආරම්භය -:

1. බෝධිසම්භාර පූරණ අවස්ථාවේදී
2. බෝධි මූලයේ දී සාක්ෂාත් කර ගැනීම.
3. සතරවන සතියේ දී පට්ඨානය මෙනෙහි කිරීම.
4. තව්තිසා දෙව්ලොව දී මාතෘ දිව්‍යරාජයාට තෙමසක් අභිධර්මය දේශනා කිරීම.
5. සාරිපුත්ත මහරහතන් වහන්සේට අභිධර්මය දේශනා කිරීම.
6. අභිධර්ම දේශනාව සාරිපුත්ත මහරහතන් වහන්සේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට පවරා දීම.

(යන කරුණු ඇසුරෙන් කළ හැඳින්වීමට ලකුණු 03යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(03) අභිධර්මය.docx

ii.

- පාලි සූත්‍ර සාහිත්‍යය සමඟ ගැළපී තිබීම.
- මූලික බුදු සමය සමඟ සමීප වීම.
- තුන්වැනි ධර්ම සංගායනාවෙන් පසුව මොවුන්ගේ අභිධර්ම ත්‍රිපිටකය සමඟ තහවුරු වීම.
- පාලි බසින් අභිධර්ම පිටකය පවත්වාගෙන යාම.
- ථෙරීය විභජ්ජවාදි සම්ප්‍රදායේ අභිධර්ම පිටකය කෘති හතකින් සමන්විත වේ.

(මේ කරුණු ඇසුරෙන් කළ විස්තරයට ලකුණු 06යි.)

iii. **ධම්මසංගණිප්පකරණය**

- සංඛ්‍යා ලේඛනයක් බදු ප්‍රභේදකරණයකින් ධර්මය විභාග කිරීම.
- මාතිකා නම් වූ මාතෘකා පෙළකින් ආරම්භ වීම.
- තික - දුක වශයෙන් හඳුන්වන මාතෘකා 122 කින් යුක්තය.
- චිත්තුප්පාද කාණ්ඩය, රූප කාණ්ඩය, නික්ඛෙප කාණ්ඩය, අට්ඨකථා කාණ්ඩය යනුවෙන් කාණ්ඩ හතරකින් අභිධර්මයේ මූලික විෂය කරුණු ඉදිරිපත් කිරීම.

(යන කරුණු ඇසුරෙන් කළ හැඳින්වීමට ලකුණු 04යි.)

පුද්ගලපඤ්ඤත්තිප්පකරණය

පෙළපොතේ 13 - 14 පිටුව ඇතුළත් විස්තරයට අනුව කළ හැඳින්වීමට ලකුණු 03යි.

3.

i.

- අභිධර්ම පිටකයෙදී නුවණින් දැක හැකි සියලු ම කරුණු හැඳින්වීමට යොදා ඇත.
- කුසලා ධම්මා - අකුසල ධම්මා - කුසල් - අකුසල් හැඳින්වීමට යොදා ඇත.
- සවිඥතා ඥානයෙන් අවබෝධ කරගෙන බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ දේශනාව ද "ධර්මය" නමින් හැඳින්වේ.
- "සබ්බේ ධම්මා අනත්තා" සියලු සංස්කාර ධර්මයන් හැඳින්වීමට භාවිතා කර ඇත.
- "ධම්මො භවේ රක්ඛති ධම්මචාරි" යන තැන ධර්මානුකූලභාවය පිළිබඳ හඳුන්වා ඇත.

(ආදි වශයෙන් නිරවුල් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 04යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(03) අභිධර්මය.docx

ii. සංඛත ධර්ම යනු සංස්කරණය වූ හටගත් ඕනෑම දෙයකි. පටිච්ච සමුප්පාදයට අනුව කුසල් හා අකුසල් සංස්කාර නම් වේ. සත්ත්වයාගේ සංසාරික පැවැත්මට ද සංඛත ධර්ම හේතු වේ. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සංස්කාර ධර්ම සියල්ල අනිත්‍ය ස්වභාවයෙන් යුක්තය. යන කරුණු වලට අදාලව විස්තර කිරීම.

(සංඛත යන්න නිර්වචනය කිරීමට ලකුණු 02යි.
විස්තර කිරීමට ලකුණු 04යි.)

iii. කිසිම හේතු ප්‍රත්‍යයාදි දෙයකින් සකස් නොවූ දෙය අසංඛත ධර්මයි. ථේරවාදි බුදු සමයෙහි පිළිගැනෙන එකම අසංස්කෘතය නිර්වාණ ධර්මය පමණි. වෙනත් ධර්ම සම්ප්‍රදායයන්හි අකාශය ද අසංස්කෘතයක් ලෙස පිළිගෙන ඇත. නිර්වාණය ද ප්‍රතිසංඛ්‍යා නිරෝධ හා අප්‍රතිසංඛ්‍යා නිරෝධ යැයි දෙකකට බෙදා අකාශය ද සමඟ එකට ගෙන අසංස්කෘත ධර්ම තුනක් කොට එම සම්ප්‍රදායයන් හි දක්වා ඇත. එහෙත් ථේරවාදී අභිධර්මයෙහි ඉගැන්වීම අනුව ලොව ඇත්තේ එකම අසංස්කෘතයක් පමණි. එනම් නිර්වාණයයි.

(සමස්ථය සලකා ලකුණු ප්‍රදානය කරන්න.)

(ලකුණු 08යි.)

4.

i. (අ) දෝමනස්ස සහගත පටිඝසම්පයුක්ත අසංඛාරික සිත.
දෝමනස්ස සහගත පටිඝසම්පයුක්ත සසංඛාරික සිත.

(නිවැරදි එක් සිතකට එක ලකුණ බැගින් ලකුණු 02යි.)

(ආ) පළමු සිත අනුන්ගේ මෙහෙයවීමක් හෝ තමා විසින්ම නැවත නැවත අභ්‍යන්තරිකව උනන්දුකරවීමක් නැතිව පහළවන සිත අසංඛාරික නම් වේ. අනුන්ගේ මෙහෙයවීමෙන් හෝ තමා විසින්ම නැවත නැවත උනන්දු කරවීමෙන් හෝ පහළවන සිත සසංඛාරික නම් වේ.

(මේ පැහැදිලි කිරීමට ලකුණු 02යි.)

ii. **දෝමනස්ස**

ඉන්ද්‍රිය ගෝචර වූ අරමුණ අප්‍රිය, අමනාප අරමුණක් වූ විට එම අරමුණ නිසා සිතෙහි යම් අප්‍රසන්න බවක්, කිලිටි බවක්, දුක් සහිත බවක් හට ගනීද එය සිතේ ඇතිවන දොම්නසට හේතු වේ.

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාභිරාජ විභාගය\ලකුණු දීමේ පටිපාටි\(03) අභිධර්මය.docx

පටිඝ

ඉන්ද්‍රිය ගෝචර වූ අරමුණ තමන්ට සතුරු බැවින් අප්‍රිය බැවින් එම අරමුණ සමඟ සිතේ ඇතිවන ගැටීම පටිඝයයි. එයම ක්‍රෝධය තරහව ලෙස ද හැඳින්වේ.

අමනාප අරමුණක් හමුවීම, නිතර කිපෙන සුලු තරහ ඇති බව. අවිජ්ජාව ප්‍රබල වීම, අරමුණ ගැන දුරදිග කල්පනා නොකිරීම (අයෝනිසෝ මනසිකාරය) නිසා වරද - නිවරද - යහපත - අයහපත නො තේරේ.

සසංඛාරික

යනු අන්‍යයන් විසින් හෝ තමාගේම සිත විසින් චරින්වර උනන්දුකරවීම නිසා හටගන්නා සිත සසංඛාරික නම් වේ. සසංඛාරික විපාක සිතකින් ප්‍රතිසන්ධි ලබා තිබීම, සිත - කය රෝගී වීම, නොඉවසීම කටයුත්තේ මනා පුරුද්දක් නැතිබව, සෘතු භෝජන ආදිය යෝග්‍ය පරිදි නොලැබීම සසංඛාරික සිත් ඇති වීමට හේතු වේ. මේ සිතේ ඊන මිද්ධ නීවරණය ක්‍රියාත්මක වේ.

(මේ කරුණු අනුව එම වචන තුන පිළිබඳව කෙරෙන හැඳින්වීම් සඳහා එකකට ලකුණු 02 බැගින් ලකුණු 06යි.)

iii. දෝෂ චෛතසිකය අකුසල චෛතසික තුදුසෙන් අටවැන්නයි. දෝෂ චතුෂ්කයට අයත් පළමු චෛතසිකයයි. වීතික්කම වීම යනු අකුසලයන් ක්‍රියාත්මක වීමේ තෙවැනි පියවරයි. නිදා සිටින අකුසලය අනුසය වන අතර පටිඝ අරමුණක් ඉන්ද්‍රිය ගෝචර වීම නිසා සිත තුළ පමණක් අවදි වී ක්‍රියාත්මක වන්නා වූ අවස්ථාව පරියුට්ඨාන නම් වේ. එයින් ද නොනැවතී කායිකව ක්‍රියාත්මක වන වාචසිකව ක්‍රියාත්මක වන අවස්ථාව වීතික්කම නම් වේ. එවිට පුද්ගලයා සමාජයේ අන්‍යයන්ට හිරිහැර වන අයුරින් චර්යාව පවත්වයි. පුද්ගල මනස තුළද නොසන්සුන් බව ඇතිවේ. පහර දීම, කඩා බිඳ දැමීම, වචනයෙන් වන පරුෂ වචන කීම වැනි සමාජ අහිතකර ක්‍රියා පවත්වයි. පළිගැනීම, බැන වැදීම, සිදු කරයි. ඒ නිසා ඔහුගේ මනස ද වික්ෂිප්ත වේ. හොඳ නරක නො තේරේ. කළයුතු නොකළ යුතු දෑ වටහා නො ගනී. සීලය වැදගත් වන්නේ මෙවැනි අවස්ථා වලය. කායික වාචසික සංවරය අත්‍යවශ්‍ය වේ.

(මේ කරුණු ඇතුළත්ව කරනු ලබන විමසීමට ලකුණු 08යි.)

5.

i. (අ) ඒකුප්පාද - සිත සමඟම එකටම හට ගැනීම.

(ආ) ඒක නිරෝධ - සිතේ බිඳීම සමඟම බිඳ වැටීම හෙවත් නිරුද්ධ වීම.

(ඉ) ඒකාලම්භන - සිතගත් අරමුණම ගැනීම.

(ඊ) ඒකවත්ථුක - සිත හට ගන්නා ඉන්ද්‍රියෙහිම හට ගැනීම.

(පාලි වචනයෙන් හෝ සිංහලෙන් ලියා තිබේ නම් එක් නිවැරදි පිළිතුරට 01 ලකුණ බැගින් ලකුණු 04යි.)

(ලකුණු 04යි.)

ii. (අ) අඤ්ඤසමාන රාශිය 13

(ආ) අකුසල රාශිය 14 52

(ඉ) සෝභන රාශිය 25

හෝ

(අ) සබ්බ චිත්ත සාධාරණ චෛතසික 07

(ආ) ප්‍රකීර්ණක චෛතසික 06

(ඉ) අකුසල චෛතසික 14 52

(ඊ) සෝභන සාධාරණ චෛතසික 19

(උ) සෝභන අසාධාරණ චෛතසික 06

(යන ක්‍රම දෙකින් එක් ක්‍රමයකට නම්කර තිබීමට ලකුණු 02යි.

මින් කවර හෝ ක්‍රමයක් පිළිබඳ හැඳින්වීමට ලකුණු 02යි.

නම් කරන ලද වර්ගීකරණයට අනුව චෛතසික සංඛ්‍යා දැක්වීමට ලකුණු 02යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බැංදිය ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(03) අභිධර්මය.docx

iii.

(අ) ඵස්ස

(ආ) වේදනා

(ඉ) සංඥා

(ඊ) චේතනා

(උ) ඒකග්ගතා

(ඌ) ජීවිතින්ද්‍රිය

(එ) මනසිකාර

ඵස්ස

අරමුණ ඉන්ද්‍රිය හා අවධානය යන කරුණු හේතුවෙන් ඇතිවන ගැටීම හෙවත් ස්පර්ශය ඵස්සය යි.

වේදනා

අරමුණක රසය විඳ ගැනීමේ ශක්තිය, සුඛ, දුක්ඛ, උපේක්ඛා යනුවෙන් මූලිකව තෙවැඳෑරුම් වේ.

සංඥා

ඉන්ද්‍රිය ගෝචර වූ අරමුණක හැඳින ගැනීම. එහි ලකෂණ හැඳින ගැනීම.

චේතනා

කායික, වාචසික, මානසික හැම ක්‍රියාවක් කරන අවස්ථාවේ ඒ ඒ කෘත්‍යයන්හි උත්සහවත් කරන ආකාරයෙන් සිතෙහි ඇතිවන ශක්තිය චේතනාවයි.

ඒකග්ගතා

ගෝචර වූ අරමුණෙහිම හිත පිහිටන ආකාරයයි.

ජීවිතේන්ද්‍රිය

නාම ධර්ම හා රූප ධර්ම නැසෙන්නට නොදී ආරක්ෂා කරන ජීවිතය දෙන්නා වූ චෛතසිකය.

මනසිකාර

අරමුණ මෙනෙහි කිරීම, ගෝචර වූ අරමුණෙහි විවිධාකාරව විමසා බැලීම.

(චෛතසික නම් කිරීමට ලකුණු 01යි.
එකක් පිළිබඳව කළ නිවැරදි කාර්ය දැක්වීමට ලකුණු 01 බැගින් 07යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බංදිධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(03) අභිධර්මය.docx

6.

i. ඝානද්වාරික අතිමහන්තාරම්මණ චිත්ත වීථි සටහන.



(නිවරදිව පිළිවෙළට දක්වා ඇති වීථි සටහනට ලකුණු 04යි.)

ii.

(අ) එක් අතීත භවාංගයකින් පසුව භාවාංග චලනය වී චිත්ත වීථිය හටගැනීම.

(ආ) 9 වැනි චිත්තක්ෂණයෙන් එවන් සිත් ආරම්භ වීම.

(ඉ) චිත්ත වීථිය අවසානයේ තදාරම්මණ සිත් දෙකක් පැවතීම.

(යන කරුණු තුන පිළිබඳව පැහැදිලි කිරීම. නිදර්ශන දැක්වීමට එක් නිවරදි කරුණකට ලකුණු 02 බැගැන් ලකුණු 06යි.)

iii. චිත්ත වීථි මූලික ප්‍රභේද 02යි. පංචද්වාර වීථි හා මනෝ ද්වාර වීථි වශයෙනි. චක්ඛු සෝතාදී ඉන්ද්‍රිය පංචකය ඇසුරින් ඇතිවන වීථි සිත් පංචද්වාර වීථි නම් වේ. මනෝද්වාරයට වැටුණු ධම්මාලම්බණයක් හේතුවෙන් උපදින වීථි සිත් මනෝ ද්වාර වීථි නම් වේ. පංචද්වාරික චිත්තවීථි අතිමහන්ත, මහන්ත, පරිත්ත, අතිපරිත්ත වශයෙන් සිවු වැදෑරුම් වේ. මේ සිවු ප්‍රභේදයට වීථි සිත් පසළොසක් එක් ද්වාරයක් පදනම් කරගෙන ඇති වේ. මනෝද්වාරික චිත්ත වීථි විභූත අවිභූත වශයෙන් දෙවැදෑරුම් වේ.

(මේ කරුණු ඇතුළත්ව කළ විස්තරයට ලකුණු 04 බැගින් ලකුණු 08යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බංද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ අවසාන\(03) අභිධර්මය.docx

Past Papers Wiki

7.

i. සීලයක පිහිටා සීලය ඇසුරුකොට සතර සතිපට්ඨානය වඩන්න.

(සරල සිංහල අදහස දක්වීමට ලකුණු 02යි.)

චාරිත්‍ර සීලය යනු - අනුගමනය කළ යුතු පිළිපැදිය යුතු කරුණු අනුව සමාදන්වන සීලයයි.

චාරිත්‍ර සීල යනු - වැළකිය යුතු කරුණු පදනම් කරගෙන සමාදන්වන සීලයයි.
උදාහරණ ලෙස පන්සිල් දැක්විය හැකිය.

(මේ හැඳින්වීමට ලකුණු 02යි.)

ii. **"කාය වාචානං සමෝධාන සීලං" (ලකුණු 01යි.)**

සීල සමාධි ප්‍රඥා යන ත්‍රි ශික්ෂා මාර්ගය ආර්ය මාර්ගය වේ. ආර්ය මාර්ගයෙන් පදනම සීලයයි. සීලයෙන් තොරව සමාධියට හෝ ප්‍රඥාවට ළඟා විය නොහැකිය. අභ්‍යන්තර වූත් බාහිරවූත් කෙලෙස් තුනී කළ හැක්කේ සීලයෙහි පිහිටා සිත හා ප්‍රඥාව වැඩීමෙන් බව " සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ යන ගාථාවෙන් සනාථ වේ. "

(මේ කරුණු සහිතව ලියා ඇති පිළිතුරට ලකුණු 05යි.)

iii.

(අ) කායානුපස්සනා සතිපට්ඨානය.

(ආ) වේදනානුපස්සනා සතිපට්ඨානය.

(ඉ) චිත්තානුපස්සනා සතිපට්ඨානය.

(ඊ) ධම්මානුපස්සනා සතිපට්ඨානය.

(පිළිවෙළින් නිවැරදිව නම් කිරීමට ලකුණු 02යි.)

කායානුපස්සනා සතිපට්ඨානය -:

(අ) අනාපාන පබ්බය (ආශ්වාස ප්‍රශ්වාස කාණ්ඩය)

(ආ) ඉරියාපථ පබ්බය (සතර ඉරියව් කාණ්ඩය)

(ඉ) සම්මජඤ්ඤපබ්බය (නුවණින් සලකා බැලීමේ කාණ්ඩය)

(ඊ) පටික්කූල මනසිකාර පව්චය (පිළිකුල් බව මෙනෙහි කිරීමේ කාණ්ඩය)

(උ) ධාතුමනසිකාර පබ්බය (සතර මහා ධාතු මෙනෙහි කිරීමේ කාණ්ඩය)

(ඌ) නව සීවථික පබ්බය (නවවිධ අමුසොහොන් කාණ්ඩය) යන

(තුදුස් ආකාර වූ සිහිය පිහිටු වීමේ අවස්ථා දක්වමින් කළ විස්තරයට - ලකුණු 06යි.)

PAST PAPERS WIKI

8.

i.

(අ) සෝවාන් මාර්ගය හා ඵලය

(ආ) සකෘදාගාමී මාර්ගය හා ඵලය

(ඉ) අනාගාමී මාර්ගය හා ඵලය

(ඊ) අරහත් මාර්ගය හා ඵලය

(මේ පිළිවෙළින් නම් කිරීමට ලකුණු 04යි.)

ii. **සකෘදාගාමී මාර්ගයෙන්**

කාමරාග, ව්‍යාපාද යන සංයෝජන දෙක තුනී කෙරෙයි.

අනාගාමී මාර්ගයෙන්

කාමරාග, ව්‍යාපාද යන සංයෝජන දෙක සමුච්ඡේද වශයෙන් (සම්පූර්ණයෙන්ම) ප්‍රහීණය කරයි.

අරහත් මාර්ගයෙන්

රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන උද්ධම්භාගීය සංයෝජන ධර්ම පස සමුච්ඡේද වශයෙන් ප්‍රහීණය කෙරේ.

(නිවැරදිව දක්වා ඇති එක් මාර්ගයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි.)

iii. වාණ සංඛ්‍යාත තෘෂ්ණාවෙන් නික්මීම - නිර්වාණය (නි+වාණ) ලෙස අර්ථ කථනය කෙරේ.

(ලකුණු 02යි.)

සෝපදිසේස නිර්වාණය යනු - ක්ලේෂ පරිනිර්වාණයයි. හෙවත් පංචස්කන්ධය ඉතිරිව තිබිය දී සන්තානගත සියලු කෙලෙසුන් අර්හත් මාර්ග ඥානයෙන් පටිප්පස්ද්ධි වශයෙන්ම ප්‍රහීණය කිරීමයි. එසේ වුවද පංචස්කන්ධය ඉතිරිව තිබෙන බැවින් එදිනෙදා සිදුවන පාරිසරික, සමාජමය වෙනස්වීම්වලට ගොදුරු වීමට සිදු වේ.

අනුපදිසේස නිබ්බාණ යනු ඉතිරිව පැවැති පංචස්ඛන්ධය ද පිරිනිවන් පෑමෙන් අවසන් කිරීමයි.

(මේ කරුණු ඇතුළත් පිළිතුරට ලකුණු 06යි.)

- ****** -

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ වර්තමාන්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(03) අභිධර්මය.docx

(iii) ''සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො - චිත්තං පඤ්ඤංච භාවයං'' යන පාඨය අනුව සීලය සමාධියටත් සමාධිය ප්‍රඥාවටත් හේතුවන අයුරු පැහැදිලි කර ඇත. සීලයෙන් ඉන්ද්‍රිය සංවරය හෙවත් කෙලෙස් වීතික්කම වීම වළකාලයි. සමථ ආදී භාවනා මගින් සමාධිය ඇතිකෙරෙන අතර එයින් කෙලෙස් පරියුට්ඨාන වීම වළකාලයි. ප්‍රඥාවෙන් අනුසය ධාශයෙන් පවත්නා කෙලෙස් උදුරා දමයි. ඒ තුනට පියවරෙන් පියවර ලඟාවිය යුතු ආකාරය ඉහත පාඨයෙන් පැහැදිලි වේ. එය අනුපූර්වක ශික්ෂා ක්‍රමයක් වන්නේ එබැවිනි.

(ප්‍රමාණවත් කරුණු හා උදාහරණ සහිතව ඉහත දැක්වූ කරුණු විස්තර කරමින් ප්‍රකාශය සනාථ කිරීමට **ලකුණු 04 කි.**)

(මුළු ලකුණු 18 යි.)

****

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

(03) අභිධර්මය

ලකුණු දීමේ පටිපාටිය

---

(03) අභිධර්මය

ලකුණු දීමේ පටිපාටිය

I කොටස සඳහා ලකුණු	**28**
II කොටස සඳහා ලකුණු	**72 (18×4)**
ලකුණු එකතුව	**100**

I කොටසේ

I, II ප්‍රශ්න සඳහා ලකුණු 2 බැගින්	04 යි.
III සිට X දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 3 බැගින්	24 යි.
	28 යි.

II කොටසේ ප්‍රශ්න අතුරින් තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අවශ්‍යය. සෑම ප්‍රශ්නයක් ම කොටස් 03කින් යුක්ත වේ.

i කොටසේ,

(අ) ප්‍රශ්නය සඳහා ලකුණු 02 බැගින් ද,

(ආ) ප්‍රශ්නය සඳහා ලකුණු 03 බැගින් ද,

ii කොටසට ලකුණු 06 බැගින් ද,

iii කොටසට ලකුණු 07 බැගින් ද, හිමි වේ.

ඉහත ආකාරයට එක් ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් ප්‍රශ්න 04 ට **ලකුණු 72ක්** හිමි වේ.

I කොටස

1.

(i)

(අ) අභිධර්ම පිටකය

(ආ) සූත්‍ර පිටකය

(ලකුණු 02 කි.)

(ii)

- ★ ධම්මසංගණීප්පකරණ
- ★ විභංගප්පකරණ
- ★ පුග්ගලපඤ්ඤත්තිප්පකරණ,
- ★ ධාතුකථාප්පකරණ
- ★ කථාවත්ථුප්පකරණ
- ★ යමකප්පකරණ
- ★ පට්ඨානප්පකරණ

(යන ග්‍රන්ථ වලින් ගතරක් ලියා ඇත්නම් එක් ග්‍රන්ථයකට ලකුණු භාගය බැගින් **ලකුණු 02 කි.**)

(iii)

- අමනාප අරමුණක් හමුවීම
- නිතර කිපෙන සුළු බව (දොස චරිතය)
- අයෝනිසෝමනසිකාරය
- මෝහය ප්‍රබලවීම

(මෙම කරුණුවලින් තුනක් හෝ ඊට සමාන කරුණු තුනක් ලියා ඇත්නම් **ලකුණු 03 කි.**)

(iv)

- සම්මා වාචා
- සම්මා කම්මන්ත
- සම්මා ආජීව

(එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු 03 කි.**)

(v)

- සක්කායදිට්ඨි
- විචිකිච්ඡා
- සීලබ්බත පරාමාස

PAST PAPERS WIKI

(එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු 03 කි.**)

(vi)

- ඕරම්භාගීය සංයෝජන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කර තිබීම.
- මෙලොවදීම රහත් නොවුවහොත් සුද්ධාවාස බ්‍රහ්මලෝකයන්හි උපත ලැබීම.
- නැවැත කාම භවයට නො පැමිණීම.
- තවමත් සේඛ ප්‍රතිපදාවේ සිටීම.

(මෙම කරුණු වලින් තුනක් ලියා ඇත්නම් එක් නිවැරදි පිළිතුරට එක් ලකුණ බැගින් **ලකුණු 03 කි)**

(vii)

- 'ඉස්සා' (ඊර්ෂ්‍යාව) යනු අනුන්ගේ යස ඉසුරු සම්පත් නොඉවසන ස්වභාවය යි. මේ නිසාම එම සම්පත් වැනසේවා යන ප්‍රාර්ථනා සහිතව ද්වේෂයෙන් ජීවත්වීම මෙයින් අදහස් වේ. ද්වේෂය සමඟම යෙදෙන චෛතසිකයකි.
- 'මච්ඡරිය' යනු තමාගේ යස ඉසුරු සම්පත් සැඟවීම ලක්ෂණය කොට ඇති චෛතසිකයකි. අන් කෙනෙක් දකිනවාටවත් අකැමති බව හා අන් අයගේ ප්‍රයෝජනයට ගැනීම නොඉවසන බව මෙහි ලක්ෂණය යි. මේ අනුව අනුන්ගේ යස ඉසුරු නොඉවසන බව ඊර්ෂ්‍යාවේ (ඉස්සා) ලක්ෂණය වන අතර තමන්ගේ යස ඉසුරු සඟවන බව මාත්සර්‍යයේ (මච්ඡරිය) ලක්ෂණය වේ.

(මේ පැහැදිලි කිරීමට **ලකුණු 03 කි.)**

(viii) 'බ්‍රහ්ම විහාර භාවනාව' යනු සම සතළිස් කර්මස්ථාන අතර ඇති 'අප්පමඤ්ඤා' භාවනා අරමුණු හතරයි.

- ★ මෙත්තා
- ★ කරුණා
- ★ මුදිතා
- ★ උපේක්ඛා යනුවෙන් ඒවා නම් කෙරේ.

(මේ හැඳින්වීමට **ලකුණු 03 කි.)**

(ix)

- **හැඳින්වීම** - හේතු යුක්තීන් අනුව තර්කානුකූලව/පදනමක් සහිතව නුවණින් මෙනෙහි කිරීම යෝනිසෝමනසිකාරය යි. යථාර්ථය ඒ අයුරින්ම මෙනෙහි කිරීම ලෙස ද දැක්වේ.
- **ප්‍රයෝජන** - ★ අනුපන් ආශ්‍රව ධර්ම නූපදී (අනුප්පන්නා ච ආසවා න උප්පජ්ජන්ති)
  ★ උපන් ආශ්‍රව ධර්ම ප්‍රහාණය වේ. (උප්පන්නා ච ආසවා පහීයන්ති)

(හැඳින්වීමට **ලකුණු 01 යි**, කරුණු දෙකට **ලකුණු 02 කි.)**

(x) 'උපාදාන පච්චයා භවො' යනු ''උපාදානය හේතු කොට ගෙන භවය වේ'' යන්න යි. උපාදානය යනු දැඩිව අල්ලා ගැනීම යි. ඒ නිසාම සක්කායදිට්ඨිය ඇති වේ. එහි ප්‍රතිඵලය වන්නේ සංඛාර රැස්වීම යි. ඒ නිසාම භවය වේ. භවය යනු නැවත උපතකට හේතු සැකසීම යි. කර්ම භව, උප්පත්ති භව (නව සත්තාවාසය)

(මේ පැහැදිලි කිරීමට **ලකුණු 03 කි.**)

II කොටස

2.

(i)

(අ) අධිගම නිදානය, දේසනා නිදානය

(අභිධම්මෙ ද්වෙ නිදානානි අධිගමනිදානං, දේසනා නිදානං)

(සිංහලෙන් හෝ පාළි පාඨයෙන් පිළිතුරු ලියා ඇත්නම් එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණ බැගින් **ලකුණු 02 කි.**)

(ආ) 'සුත්තන්තපරියාය' යනු සූත්‍ර පිටකයේ අන්තර්ගත දේශනා පවත්වා ඇති ක්‍රමය යි. අභිධර්ම දේශනා ක්‍රමය 'අභිධර්මපරියාය' ලෙස හැඳින්වේ. සුත්තන්ත පරියායේ මූලික ලක්ෂණය වන්නේ ධර්ම කරුණු, උපමා රූපක, උපමේය ආදිය භාවිත කරමින් සාහිත්‍යාත්මක ලෙස ඉදිරිපත් කර තිබීම යි.

(මේ කරුණු ඇතුළත් හැඳින්වීමට **ලකුණු 03 ක්** හිමි වේ.)

(ii)

- සප්තප්පකරණයෙන් යුක්ත වේ.
- පාළි භාෂාව පදනම් කරගෙන - පාලි සූත්‍ර සාහිත්‍යයට ගැළපෙන අයුරින් කරුණු දක්වා තිබීම.
- සත්ත්වයා හා ලෝකය නිරවශේෂ වශයෙන් බෙදා වෙන්කර දැක්වීමේ මතයක් ගොඩ නැගීම.
- ලෝකයේ පවත්නා සියල්ල ''ධම්ම'' යන පදයෙන් දැක්වීම.
- ධම්ම යන මූලික සංකල්පය - සතර පරමාර්ථ අනුව ප්‍රභේද කොට දැක්වීම.

(යන කරුණු ඇතුළත් හැඳින්වීමට **ලකුණු 06 කි.**)

(iii) **ධම්මසංගණිප්පකරණය**

- ථෙරවාද අභිධර්ම සම්ප්‍රදායයේ කේන්ද්‍රීය ග්‍රන්ථය යි.
- අභිධර්ම කරුණු සංඛ්‍යා ලේඛනයක් ලෙස වර්ග කර, විභාග කර ඉදිරිපත් කිරීම.
- මාතිකා නම් වූ පූර්ණ මාතෘකා අනුව කරුණු ගොනු කිරීම.
- එබඳු මාතෘකා 122 කින් යුක්තය.
- චිත්තුප්පාද කාණ්ඩය, රූප කාණ්ඩය, නික්ඛෙප කාණ්ඩය, අට්ඨකථා කාණ්ඩය යන සිව් වැදැරුම් කාණ්ඩ වලින් යුක්තය.

(මේ කරුණු ඇතුළත්ව ලියා ඇති විස්තරයට **ලකුණු 07 කි.**)

(මුළු ලකුණු 18 යි.)

3.

(i)

(අ) සබ්බෙ ධම්මා අනත්තාති - යදා පඤ්ඤාය පස්සති

අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා

(ගාථාව සම්පූර්ණ කිරීමට **ලකුණු 02 කි.**)

(ආ) නිර්වාණ ප්‍රඥප්තිය සහිත වූ සියලු ධර්මයෝ (සංඛත + අසංඛත ධර්ම) අනාත්ම යැයි යම් විටෙක විදසුන් නුවණින් දකී ද එවිට දුකෙහි කළකිරේ. මේ කළකිරීම නිවන් ලැබීමට (උපාය) මාර්ගය වේ. සුවිසුද්ධ වූ මගයි.

(මේ සරල අදහස ලිවීමට **ලකුණු 03 කි.**)

(ii)



(මේ කරුණු පැහැදිලිව දක්වා තිබේ නම් සටහනකින් තොරව වුවද **ලකුණු 06 කි.**)

Past Papers Wiki

(iii)

- **සම්මුති සත්‍යය** - ප්‍රඥප්තිය ලෙස ද සැලසේ. ඇති සැටියට සිතට දැනෙන දේවල් අපි හඳුනාගෙන සම්මත කරගෙන සිටිමු. ඒවා සම්මුති සත්‍යය වේ. මේස, පුටු, වස්ත්‍ර, මිනිසා, බල්ලා, ගම පොළව, ඉර, හඳ යන මේ සියල්ල අපි සම්මත කරගත් දේවල් ය. වස්තුවල ධර්මතාව මත සංඛත හෙවත් සංඛාර ලෝකය තුළ ඇත්තේ සියල්ල ම ප්‍රඥප්තීන් හෙවත් සම්මතයන් වේ. සම්මතයන් තුළ චතුර්විධ විපල්ලාසය දකිමු.
- **පරමාර්ථ සත්‍යය** - සම්මතයෙන් ඔබ්බට ගිය යථාර්ථවත්ව පවතින සියල්ලම පඨවී, ආපෝ, තේජෝ, වායෝ යන මහාභූත රූප හා උපාදාය රූප සහිතව බව, විපල්ලාස ලෙස නොදැකිය යුතු බව ය. ඉහත කී සම්මුතීන් සියල්ලම මේ රූප කොටස් ලෙස බෙදාගත හැකිය. එය පරමාර්ථ සත්‍යය යි.

(මේ පැහැදිලි කිරීමට **ලකුණු 07 කි)**

(මුළු ලකුණු 18 යි.)

4.

(i)

(අ) ★ ලෝභ, දෝස, මෝහ

(කරුණු දෙකක් නිවැරදිව ලියා ඇත්නම් **ලකුණු 01 කි,**
කරුණු තුනම නිවැරදිව ලියා ඇත්නම් **ලකුණු 02 කි)**

(ආ) දිට්ඨිසම්පයුත්ත බව ඇතිවීමේ හේතු :-

- අයෝනිසෝ මනසිකාරය
- මිසදිටු ඇත්තවුන්ගේ ඇසුර
- ධර්මයෙන් වෙන්ව, ඇත්ව වාසය කිරීම
- නොමනා වැරදි කල්පනා බහුල කොට සිටීම.
- මෝහය බහුල වීම. (ද්විහේතුක ප්‍රතිසන්ධිය)

(යන කරුණුවලින් තුනක් නිවැරදිව දක්වා ඇත්නම් **ලකුණු 03 කි.)**

(ii) (01) සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත **(ලකුණු 02 කි.)**

(02) සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුක්ත සසංඛාරික සිත **(ලකුණු 01 කි.)**

මෙහෙයවීමකින් තොරව කිරීම අසංඛාරික බවයි, මෙහෙයවීමකින් කිරීම සසංඛාරික බව

(මෙම කරුණු දෙක උදාහරණ සහිතව පෙන්වා තිබීමට **ලකුණු 03 කි.)**

PAST PAPERS WIKI

(iii) පුද්ගල සන්තානය තුළ නිලීනව හෙවත් අනුසය වශයෙන් පවත්නා විවිධාකාර වූ අකුසල ධර්මයෝ ලෝභය, දෝසය, මෝහය නිසා මතු වී එති. මේ අකුසල මූල නිසා අකුසල චෛතසික තුදුසම ක්‍රියාත්මක වේ. ඒ අනුව අකුසල් සිත් දොළසම ඇතිවේ. මෝහය ප්‍රබලම අකුසල සාධාරණ චෛතසිකයකි. මේ නිසා පුද්ගල සන්තානයේ පරිහානියට හෙවත් කුසල සිත් ඇති නොවන නොහැකි තත්ත්වයකට පත් වේ. නූපන් අකුසල් පවා උපදී. උපන් අකුසල් වැඩි දියුණු වේ.

(මේ කරුණු ඇසුරෙන් පරිහානිය සිදුවන අයුරු පෙන්වාදීමට **ලකුණු 07 කි.**)

(මුළු ලකුණු 18 යි.)

5.

(i)

(අ) 01) සබ්බචිත්ත සාධාරණ චෛතසික (07)

02) ප්‍රකීර්ණක චෛතසික (06)

(එක් නිවැරදි නම් කිරීමකට එක් ලකුණ බැගින් **ලකුණු 02 කි.**)

(ආ)

- **සබ්බචිත්ත සාධාරණ චෛතසික** - ඵස්ස, වෙදනා, සඤ්ඤා, චේතනා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාර යනුවෙන් චෛතසික සංඛ්‍යාව හතකි. අසූ නවයක් (89) හෝ එකසිය විසි එකක් (121) වූ සියලුම සිත්වල අනිවාර්යයෙන් ම යෙදෙන බැවින් සබ්බ චිත්ත සාධාරණ නම් වේ.

(මේ කරුණු ඇතුළත් හැඳින්වීමට **ලකුණු 03 කි.**)

- ප්‍රකීර්ණක චෛතසික - විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද යනුවෙන් චෛතසික සංඛ්‍යාව හයකි. මෙම චෛතසික හය ද, කුසල, අකුසල භේදයකින් තොරව සියලු සිත්වල අවශ්‍ය පරිදි සමහර අවස්ථාවක යෙදෙමින් සමහර අවස්ථාවක නොයෙදෙමින් විසිර පවත්නා බැවින් ප්‍රකීර්ණක නම් වේ.

(මේ කරුණු ඇතුළත් හැඳින්වීමට **ලකුණු 03 කි.**)

මෙම පිළිතුරු දෙකින් එකක් පමණක් ලියා තිබීම ප්‍රමාණවත් ය.

(ii) **අප්පමඤ්ඤා චෛතසික** :- මේ නමින් හඳුන්වන චෛතසික සංඛ්‍යාව දෙකකි. කරුණා, මුදිතා යනුවෙන් එය හැඳින්වේ. මේ චෛතසික දෙක අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කෙරෙන බැවින් එම නමින් හැඳින්වේ.

කරුණාව යනු :- දුක්ඛිත සත්ත්වයන් අරමුණු කරමින් ඇතිවන අනුකම්පා කරන ස්වභාවයයි. සත් පුරුෂයන්ගේ සිත් තුළ පරදුක්ඛය කම්පනයක් ඇති වේ. ඔවුන් එම දුකින් මුදවාගැනීමට අදහස් කරයි/ක්‍රියාකරයි. බෝසතාණන් වහන්සේලාගේ සිත් තුළ මේ චෛතසිකය අනිවාර්යෙන් ඇති වේ.

මුදිතා චෛතසිකය :- අප්‍රමාණ සුඛිත සත්ත්වයන් අරමුණු කොටගෙන සතුටුවීම් ආකාරයෙන් ඇතිවන පර සම්පත දකින අසන කල්හි හටගන්නාවූ එයට අනුකූල වූ ස්වභාවය යි. මෙය අකුසල පක්ෂයේ ඉස්සා චෛතසිකයට ප්‍රතිපක්ෂය තම දූ දරු හිත මිතුරු ආදීන්ගේ සම්පත් යස ඉසුරු දැකීමෙන් ඇතිවන ස්වභාවය යි. මෙය ලෝභයාගේම ස්වභාවයක් විනා මුදිතාව කුසල චෛතසිකයක් නොවේ.

(චෛතසික දෙක නම් කිරීමට **ලකුණු 02 කි,**
චෛතසික පිළිබඳව හැඳින්වීම් සඳහා එකකට ලකුණු 02 බැගින් **ලකුණු 04 කි.)**
(02 + 04 = 06)

(iii) **සද්ධා චෛතසිකය** :- ශෝභන සාධාරණ චෛතසිකවල ආරම්භක චෛතසිකය යි. මේ සමග තවත් චෛතසික දහ අටක් යෙදේ. බුද්ධාදි ඉෂ්ටාලම්බනයකින් ඇති වේ. තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් පැහැදවීමේ ලක්ෂණයෙන් යුක්තය. මෙහි මූලික ප්‍රභේද දෙකකි. සම්පසාදන **ලක්ඛණ සද්ධා** හා **සම්පක්ඛන්ධන** ලක්ඛණ සද්ධා නමිනි. ශ්‍රද්ධාව ඉන්ද්‍රිය ධර්මයක්, බල ධර්මයක්, ධනයක්, බීජයක් ආදි වශයෙන් විවිධාකාරයෙන් ධර්මය තුළ දැක්වේ.

ශ්‍රද්ධාව පෙරදැරිවීම යනු :- ශෝභන සාධාරණ එකුන් විස්සම සන්තානය තුළ ක්‍රියාත්මක වීම යි. එවිට අකුසලයෙන් පෑත් වී කුසලයම ක්‍රියාත්මක වේ. සම්පසාදන ලක්ඛණ සද්ධාවෙන් කෙරෙන්නේ සිතේ පවත්නා අකුසල ගති ලක්ෂණ යටපත්කිරීම. සිත පිරිසිදු කිරීම ය. පිරිසිදු සිතින් කයින්, වචනයෙන් කරන සියල්ල කුසල් බවට පත් වේ. කය වචනය සිත විවිධාකාර වූ කුසල් සඳහා යොමු වන්නේ ශ්‍රද්ධාව පෙරටුකරගත් එකුන් විසි චෛතසික නිසා ය. මේ කරුණු ඇතුළත්ව පැහැදිලි කර තිබීම අවශ්‍යය.

(හැඳින්වීමට **ලකුණු 03 කි,**
කුසලයට යොමුවීම පැහැදිලි කිරීමට **ලකුණු 03 කි.)**
(මුළු ලකුණු 18 යි.)

6.

(i)

(අ) ★ රූප

★ වේදනා

★ සංඥා

★ සංඛාර

★ විඤ්ඤාණ

(අවම වශයෙන් කරුණු තුනක් පිළිවෙලින් නම්කර ඇත්නම් එක් ලකුණක් ද පහම නම්කර ඇත්නම් **ලකුණු 02** ක් ද හිමි වේ.)

(ආ) රූප - රූප පරමාර්ථය

වේදනා, සංඥා, සංඛාර - චෛතසික පරමාර්ථ

විඤ්ඤාණ - චිත්ත පරමාර්ථය

(පැහැදිලිව බෙදා නම් කිරීමට **ලකුණු 03 කි.**)

(ii) චේතනාවම කර්මය ලෙස වදාරමි. චේතනා සහිතව කයින්, වචනයෙන්, මනසින් කර්ම කරයි.

(පාළි පාඨයේ අදහස සරල බසින් ලිවීමට **ලකුණු 02 කි.**)

සංඛාරස්කන්ධය :- මෙම සංඛාරස්කන්ධය ලෙස සැලකෙන්නේ සය වැදෑරුම් වූ චේතනා සමූහයක් වේ.

- චක්ඛු සම්ඵස්සජා චේතනා
- සෝත සම්ඵස්සජා චේතනා
- ඝාණ සම්ඵස්සජා චේතනා
- ජිව්හා සම්ඵස්සජා චේතනා
- කාය සම්ඵස්සජා චේතනා
- මනෝ සම්ඵස්සජා චේතනා යනුවෙන් ඒවා නම් කෙරේ.

සංස්කාරයෝ කෙසෙල් කඳකට උපමා කර ඇත. **"සංඛාරා කදලූපමා"** යනුවෙන් එය දැක්වේ. මින් අදහස් කරන්නේ සංස්කාරයෝ හර නැති කෙසෙල් ගස් වැනි බව ය. ලෝභාදී අකුසල මූලයන් නිසා අපුඤ්ඤාභි සංඛාර රැස් කෙරෙති. ඒවාද හරසුන්ය. අලෝභාදී කුසල මූලයන් පුඤ්ඤාභි සංඛාර රැස් කෙරෙති. ඒවා ද යථාර්ථවත්ව බලන කල සසර දික් කරමින් හරසුන් බව පෙන්වයි. මහග්ගත කුසල් නිසා ආනෙඤ්ජාභි සංඛාර රැස් කෙරෙති. ඒවා දීර්ඝ කාලින වුවද අවයව හරයක් නැත.

(මේ කරුණු ඇතුළත් විස්තරයට **ලකුණු 04 කි.**)

(iii) අනිච්චේ නිච්චන්ති, දුක්ඛේ සුඛන්ති, අසුභේ සුඛන්ති, අනත්තේ අත්තානි යනුවෙන් විපල්ලාස හතරකි.

(පාලියෙන් හෝ සිංහලෙන් මෙම හතර නම්කර තිබීමට **ලකුණු 04 කි.**)

පුද්ගලයා ලෝකය දෙස යථාර්තවාදීව නොබලන නිසා මොහොතක් පාසා වෙනස්වන ක්ෂණික කාරණා ස්වභාවය තේරුම් නොගනී. නිත්‍ය සුඛ - සුඛ ආත්ම ලෙස සියල්ල දකී. ඒ නිසාම ලෝකයේ පවත්නා සැබෑ ස්වභාවය වූ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව කිසිවිටක නොදකී. සදාකාලික බව එකසේ පවතින බව පිළිබඳ මඤ්ඤනා ලෙස බැලීමෙන් සක්කායදිට්ඨිය ඇති වේ. මේ නිසා තමාගේ කරගැනීම, තමාට අයත් බව යනාදිය නිතර සිතයි. තමා අන්‍යයන්ගෙන් වෙන් වූවකු ලෙස නිතර සිතයි. එය පුහුදුන් බව මේරීමට පදනම් වේ.

(මේ කරුණු ඇතුළත්ව උදාහරණ අවශ්‍ය ලෙස සපයමින් ලියා ඇති පැහැදිලි කිරීමට **ලකුණු 03 කි.**)

(මුළු ලකුණු 18 යි.)

7.

(i)

(අ) ප්‍රතිසන්ධි සිත ඉපිද නිරුද්ධ වූ පසු එම විපාක සිත, එම අරමුණම ගෙන භවයාගේ අවසානය තෙක් චිත්ත සන්තතිය පවත්වා ගැනීමේ කාර්ය සිදු කරන්නේ භවාංග සිතෙනි. වර්තමාන භවයෙන් අරමුණු ගෙන සිත් නූපදිනා සෑම කල්හිම මේ භවාංග සිත පහළ වේ.

(මේ දැක්වීමට **ලකුණු 02 කි.**)

(ආ) උප්පාද, ඨිති, භංග

(ලකුණු 03 කි.)

(ii)

- **පංචද්වාරාවජ්ජන** :- චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය යන පසිඳුරන්ගෙන් හා මනෝද්වාරයෙන් ගනු ලබන අරමුණුවලට භවාංග සිත් පරම්පරාව යොමු කිරීම ආවර්ජන යි, අලුත් අරමුණ දැනගැනීම, (ආවජ්ජන) කිරීම සිදු කරයි.

- **සොතවිඤ්ඤාණය** :- අපරිහිත්ත සෝතයන් ශබ්දය හා වායෝ ධාතුවත් යන සාධක තුනේ එකතුවෙන් සොත විඤ්ඤාණය ඇති වේ. ආවර්ජනා කෘත්‍යගේ ඊළඟ පියවර මේ විඤ්ඤාණ සිත පහළවීම යි.

- **සම්පටිච්ඡන** :- පඤ්චද්වාරයේ වැදගත්තා වූ, අරමුණු, චක්ඛු යෝතාදි විඤ්ඤාණයන් බවට පත් වූ පසු රූප ශබ්දා දී අරමුණු වශයෙන් පිළිගැනීම සම්පටිච්ඡන කෘත්‍යය වේ.

(මේ එක් කරුණත් නිවැරදිව පැහැදිලි කිරීමට ලකුණු 02 බැගින් **ලකුණු 06 කි.**)

(iii) අතිමහන්තාරම්මණ ශ්‍රෝතද්වාරික චිත්තවිථි සටහන :-

1	2	3	4	5	6
භ	න	ද	ප	සෝ	සං
• • •	• • •	• • •	• • •	• • •	• • •
අතීත භවංග	භවංග චලන	උපච්ඡේද	පංචද්වා රාවජ්ජන	සෝත විඤ්ඤාණ	සම්පටිච්ඡන

7	8	9	10	11	12
ණ	වො	ජ	ජ	ජ	ජ
• • •	• • •	• • •	• • •	• • •	• • •
සංතීරණ	වොත්ථපන	ජවන	ජවන	ජවන	ජවන

13	14	15	16	17
ජ	ජ	ජ	ත	හ
• • •	• • •	• • •	• • •	• • •
ජවන	ජවන	ජවන	තදාරම්මන	තදාරම්මන

(චිත්තවිථි සටහන් දැක්වීමට **ලකුණු 03 කි.**)

අතිමහන්තාරම්මණ චිත්තවීථිය, තදාරම්මණ චිත්තවීථිය ලෙස ද හඳුන්වයි. ඒ තදාරම්මණ අවස්ථා දෙකක් චිත්තවීථිය අවසානයේ ඇති බැවිණි. එය එක් අතීත භවංගයකට පසුව භවාංග චලනය වී චිත්තවීථිය ඇතිවීමට පටන්ගනී. මහන්තාරම්මණ චිත්තවීථියක තදාරම්මණ අවස්ථාව නැත. ජවන ආරම්භ වන්නේ වීත්තවීථියේ නව වැනි අවස්ථාවෙ කොටස 10 වැනි හෝ 11 අවස්ථාවෙනි. එයට හේතුව අතීත භවාංග දෙකක් හෝ තුනකින් පසුව භවාංග චලනය වීම යි. එය තරමක් දුර්වල චිත්තවීථි වේ.

(මේ වෙනස පැහැදිලි කිරීමට **<u>ලකුණු 02 කි.</u>**)

(මුළු ලකුණු 18 කි.)

8.

(i)

(අ) ★ ප්‍රතිසන්ධි විපාක

★ ප්‍රවෘත්ති විපාක

<u>(ලකුණු 02 කි.)</u>

(ආ) ★ අභිධ්‍යා

★ ව්‍යාපාද

★ මිච්ඡාදිට්ඨි

<u>(ලකුණු 03 කි.)</u>

(ii) ★ ජනක

★ උපස්ථම්භක

★ උපපීඩක

★ උපඝාතක

<u>(ලකුණු 04 කි.)</u>

ජනක කර්මය යනු :- උපත ලබාදීම හා ලබාගත් උපත අනුව ජීවිතය පවත්වාගැනීම යන කාර්යයන් දෙකම ජනක කර්මයෙන් ඉටු කරයි. හෙවත් ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාක යන විපාකද්වයම ඇති කරයි. කර්ම පථයක් බවට පත්වූ කුසල හෝ අකුසල කර්මයකින් ම පමණක් ප්‍රතිසන්ධි විපාක ලබාදෙන අතර එබඳු කර්මයකින් නැවත කිසිවිටෙක ප්‍රතිසන්ධියක් ලබානොදේ. එහෙත් ප්‍රවෘත්ති විපාක වශයෙන් නැවත නැවත කුසලය හෝ අකුසලය අවසන්වන තුරු විපාක ලබාදේ.

(මේ කරුණු ඇතුළත් විස්තරයට **<u>ලකුණු 03 කි.</u>**)

(iii) ලෝකයේ ජීවත්වන පුද්ගලයාට මුහුණ දීමට සිදුවන නියාම ධර්ම පහකි. කම්ම නියාමය එයින් එකක් පමණි. ඒ නිසාම සියල්ල කර්මය නිසා සිදුවන බව පිළිබඳ සංඥා විපල්ලාසය; බැහැර කිරීමට සිදු වේ. උතුනියාම (පාරිසරික සෘතු විපර්යාසය) බීජ නියාම (වාතය - බීජවල පවත්නා අනන්‍ය වූ ලක්ෂණ) ධම්ම නියාම (ලෝකයේ පවත්නා ධර්මතා - චිත්ත නියාම (සිත හා සිතුවිලි ඇතිවෙන නියමානුකූල ක්‍රමය) යන අනෙකුත් සකර වැදැරුම් නියාම ධර්මයන් ද මිනිසාගේ එදිනෙදා ජීවිත පැවැත්මට බෙහෙවින් බලපායි.

(මේ නිසා කර්ම නියාමයට අමතරව අනෙකුත් නියාම ධර්ම හතර ඇසුරෙන් උදාහරණ සහිතව පැහැදිලි කිරීමට **ලකුණු 07 කි.)**

(මුළු ලකුණු 18 යි.)

9.

(i)

(අ) සීලය යම් තැනෙක වේද ප්‍රඥාව එතැන ය - ප්‍රඥාව යම් තැනෙක ද සීලය එතැන ය. සීලය හා ප්‍රඥාව අතර පවත්නා අන්‍යොන්‍ය සබඳතාව හා එහි වටිනාකම මින් පැහැදිලි වේ.

(මේ දැක්වීමට **ලකුණු 02 කි.)**

(ආ) විරති සීලය යනු වැළකීම හෙවත් වෙරමණි සීලය යි. විරතියට හේතුවන කරුණු සම්පන්න විරති, සමාදාන විරති හා සමුච්ඡේද විරති ලෙස තෙවැදෑරුම් විය. විරති සීලය සම්මා වාචා විරති සීලය හෙවත් වචනයෙන් කෙරෙන වැරදි තුනෙන් වෙන්වීමක් අදහස් කෙරේ. එමෙන්ම ජීවිත පැවැත්ම සඳහා වැරදි පිළිවෙත් අනුගමනය කිරීමෙන් වැළකීමත් මේ සීලයට අයත් වේ.

(මේ කරුණු ඇතුළත්ව විරති සීලය පිළිබඳව හඳුන්වා තිබීමට **ලකුණු 03 කි.)**

(ii) **සීලය යනු :-** "කාය වාචානං සමොධානං සීලං" යනුවෙන් දක්වා ඇති අන්දමට කාය වචන දෙකේ සංවර භාවය සීලය යි. කයින් කෙරෙන අකුසල ධර්ම තුන සහ වචනයෙන් කෙරෙන අකුසල ධර්ම හතර නොකර සිටීම සීලය යි. අනුසස් වශයෙන් පවත්නා කෙලෙස් වීතික්කම බවට පත්වීමෙන් ඉන්ද්‍රියන් අසංවර වේ. එය සමාජයේ අන්‍යයන්ට ප්‍රශ්නයක් ලෙස බලපායි. මේ තත්ත්වය වළක්වාගත හැක්කේ අවස්ථාව අවබෝධ කර ගැනීමෙන් හා යොනිසෝ මනසිකාරයෙන් යුතුව ඉඳුරන් සංවර කර ගැනීමෙනි. අත්තාදිපතෙය්‍ය, ධම්මාදිපතෙය්‍ය, ලෝකාදිපතෙය්‍ය වශයෙන් සිතිමට යොනිසෝ මනසිකාරය අවශ්‍යය.

(මේ කරුණු අනුව කරුණු ලබන පැහැදිලි කිරීමට **ලකුණු 06 කි.)**

රහස්‍යයි

ඇගයීම් කාලාවෙන් පිටතට රැගෙන යාම තහනම්

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය -

2018 (2019)

-ලකුණු දීමේ පරිපාටිය -



(03) අභිධර්මය

පරීක්ෂකවරයාගේ නම :.

සංකේත අංකය :- 91/2/4/10/2019/03/S/...

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත. සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය යි

කරුණාකර මෙම ලකුණු දීමේ පටිපාටිය ඇගයීම් ගාලාවෙන් පිටතට කෙනයාමෙන් වලකින්න

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

ලකුණු දීමේ පටිපාටිය



(03) අභිධර්මය

පරීක්ෂකවරයාගේ නම :-.....

සංකේත අංකය :- 91/3/2/01/2022/03/S/.....

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ආයතනික විභාග ඇගයීම් ශාඛාව
පැලවත්ත,
බත්තරමුල්ල.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත. **සියලුම හිමිකම් ඇවිරිණි.**

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

(03) අභිධර්මය

ලකුණු දීමේ පටිපාටිය

I කොටස සඳහා ලකුණු	-	28
II කොටස සඳහා ලකුණු	-	72 (18 x 4)
ලකුණු එකතුව	-	100

01 වන ප්‍රශ්නයේ i,ii කෙටි ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලට ලකුණු 02 බැගින් ද iii,iv,v,vi,vii,viii,ix,x කෙටි ප්‍රශ්න සඳහා ලකුණු 03 බැගින් ද හිමිවන බැවින් 01 ප්‍රශ්නයට මුළු ලකුණු 28 ක් හිමි වේ.

II කොටසේ ප්‍රශ්න අතුරින් තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අවශ්‍ය ය. සෑම ප්‍රශ්නයක් ම කොටස් 03 කින් යුක්ත වේ.

i කොටසේ (අ) ලකුණු 02 බැගින් ද (ආ) ලකුණු 03 බැගින් ද

ii කොටසට ලකුණු 06 බැගින් ද

iii කොටසට ලකුණු 07 බැගින් ද හිමි වේ.

මේ අනුව එක් ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් ප්‍රශ්න 04 ට ලකුණු 72 ක් හිමි වේ.

I කොටස

01.

(i) (අ) දේසනා නිදානය

(ආ) අධිගම නිදානය

(ලකුණු 02 යි)

(ii)

- ථෙරවාදී විභජ්ජවාදී සම්ප්‍රදාය.
- සර්වාස්තිවාදී වෛභාෂික සම්ප්‍රදාය.
- ධර්මගුප්තික නිකායේ ශාරිපුත්‍ර සම්ප්‍රදාය.
- බහුශ්‍රැතිය අභිධර්ම සම්ප්‍රදාය.
- මහායාන යෝගාචාර සම්ප්‍රදාය.

(මේ පිළිතුරුවලින් දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි)

(iii) අතිරේක සංග්‍රහයක් වූ අට්ඨකථා කණ්ඩයේ - කුසලය යනු කුමක්ද? අකුසලය යනු කුමක්ද? ආදී වශයෙන් ප්‍රශ්න නගා ඊට පිළිතුරු වශයෙන් කළ පැහැදිලි කිරීම් ඇතුළත් වේ.

(ලකුණු 03 යි)

(iv) චිත්ත, චෛතසික, රූප, නිර්වාණ

(නම් කිරීමට ලකුණු 01 යි)

චෛතසික යනු සිත සමග එකට උපදින එකට නැතිවෙන එකම අරමුණු ගන්නා සිතුවිලිය. ඒවා දෙපනසකි.

අඤ්ඤ සමාන	13
අකුසල	14
සෝභන චෛතසික	25

(මේ කරුණුවලට ලකුණු 02 යි)

(v) උපේක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජනය
උපේක්ඛා සහගත මනෝද්වාරාවජ්ජනය
සෝමනස්ස සහගත හසිතුප්පාදය

(එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)

(vi)

- නොබිඳුණු ඇසක්, නිරෝගි සසම්භාර චක්ඛුව පැවතීම.
- රූපයක් ඇසට ගැටීම හෙවත් අරමුණු වීම, හමුවීම.
- ඒ පිළිබඳව අවධානය, සැලකිල්ල යොමු කිරීම.

(මේ කරුණුවලින් නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)

(vii)

- තමා සතු දේ අන්‍යයන්ට අයිතිවීම දැකීම නොඉවසීම.
- තමා අයත් දෙයකින් අනෙක් අය ප්‍රයෝජනය ගැනීම නොඉවසීම.
- තමාට සේ සම්පත් අන්‍යයන්ට ලැබීම නොඉවසීම.
- තමාගේ සම්පත් අන්‍යයන්ගෙන් සැඟවීම.

(මේ කරුණුවලින් තුනක් ලියා ඇත්නම් ලකුණු 03 යි)

(viii)

- සීත උෂ්ණ ආදියෙන් වෙනස් වේ.
- ධාතූන්ගේ අසමබර බව නිසා වෙනස් වේ.
- ලක්ඛණ රූපයන්ගේ ස්වභාවයන්ට ලක්වෙන නිසා.
- විවිධ රෝගාබාධා නිසා (කර්ම රෝග, විශේෂයි)

(මේ කරුණු වලින් එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)

(ix)

- සීල, සමාධි , ප්‍රඥා

(ලකුණු 01 යි)

- සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි

(ලකුණු 02 යි)

(x)

- තණ්හාවේ නිරෝධය හෙවත් දුරු කිරීම නිවනයි

(ලකුණු 01 යි)

- කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා

(ලකුණු 02 යි)

II කොටස

02.

(i)

(අ)

- පාරිභාෂිත පද, නිශ්චිත අර්ථ සහිත පද භාවිතය.
- සාහිත්‍ය භාෂාව වෙනුවට, වර්ග කරමින් විභජනය කරමින් කරුණු ඉදිරිපත් කිරීම.

(එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණ බැගින් ලකුණු 02 යි)

(ආ)

- උපමා උපමේය ගැළපීම හා සැසඳීම.
- කතා පුවත් මගින් උදාහරණ සපයමින් ඉදිරිපත් කිරීම.
- ජනතාවට සවනට මිහිරි ලෙස ජනකාන්ත ශෛලියකින් ඉදිරිපත් කිරීම.
- පාරිභාෂිත පද වෙනුවට සාහිත්‍යමය බස යොදා ගැනීම.

(එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)

(ii) **ධම්මසංගණිප්පකරණය :-**

- ථෙරවාදි අභිධර්ම සම්ප්‍රදායයේ සප්තප්‍රකරණයට අයත් ය.
- මාතිකා හෙවත් මාතෘකා පෙළක් පැවතීම. මාතෘකා 122 ක් පවති.
- සංඛ්‍යා ලේඛනයක් බඳු ප්‍රභේද කරණයකින් කරුණු ඉදිරිපත් කිරීම.
- කුසල - අකුසල අව්‍ය කෘත ලෙස ත්‍රික වශයෙන් මාතිතං 22 ක් වේ.
- කරුණු දෙකක් පමණක් ඇති සහේතුක - අහේතුක වැනි කරුණු දුක ලෙසද දැක්වීම.
- චිත්තුප්පාද කණ්ඩය, රූප කණ්ඩය, නික්ඛෙප කණ්ඩය හා අට්ඨ කථා කණ්ඩය ලෙඟ කණ්ඩ හතරකින් මාතිකාවලට පසුව අභිධර්ම කරුණු ඉදිරිපත් කරයි.

(මේ කරුණු ඇතුළත් පිළිතුරට ලකුණු 03 යි)

විභංගප්‍රකරණය :-

- ථෙරවාදි අභිධර්ම සම්ප්‍රදායේ සප්තප්‍රකරණයට අයත් ය.
- සුත්තන්ත භාජනීය : අභිධම්ම භාජනීය හා පඤ්හ පුච්ඡා යන න්‍යාය තුනකට අනුව කරුණු විභාග කෙරේ.
- මාතෘකා දහ අටක් එම න්‍යාය තුනට අදාළව විභාග කෙරේ.
- මාතෘකා දහ අටෙන් මුල් කරුණු 06 පුද්ගලයන්ගේ මානසික හා කායික සංඝටක පිළිබඳ කරුණු දැක්වීමකි.
- එම සංඝටක හසුරුවන ප්‍රධාන බලවේග ලෙස අනිත්‍ය හා පටිච්ච සමුප්පාදය දක්වයි.
- හත්වැන්නේ සිට දොළොස්වැන්න දක්වා මාතෘකා 06 පුද්ගලයා සසරින් මුදවන මාර්ගයේ අංග ලෙස දැක්වේ.
- ඉතිරි කරුණු 06 නැවැතත් මුල් කරුණු 06 පිළිබඳ වඩාත් විස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කෙරේ.

(මේ කරුණු ඇතුළත් හැඳින්වීමට ලකුණු 03 යි)

(iii) **සර්වාස්තිවාදී අභිධර්ම සම්ප්‍රදාය**

- ථෙරවාදි විභජ්ජවාදී සම්ප්‍රදායයෙන් වෙන්වුණු කොටසක් මේ නව සම්ප්‍රදාය ආරම්භ කිරීම.
- මේ සම්ප්‍රදාය මහායානිකයන්ට පවා බලපෑම් කළේය.
- ථෙරවාදීන්ගේ පාලි සූත්‍රවලට අනුගත වූ අභිධර්මය වෙනුවට සංස්කෘත භාෂාවෙන් වෙනම සකස් කළ ග්‍රන්ථ හතකින් යුතුව තම සම්ප්‍රදාය ඉදිරිපත් කරයි.
- ථෙරවාදී සම්ප්‍රදායයේ සතර පරමාර්ථ ධර්ම වෙනුවට ඒවාට අමතරව චිත්ත විප්‍රයුක්ත ධර්ම ලෙස තවත් ධර්ම 14 ක් ඉදිරිපත් කෙරේ.
- ථෙරවාදීන්ගේ නිර්මාණය එකම අසංඛත ධර්මය වුවද, සර්වාස්තිවාදීන් එය ප්‍රතිසංඛා නිරෝධය අප්‍රතියංඛ නිරෝධය හා ආකාස වශයෙන් තෙවැදෑරුම් කොට දක්වති.

(මේ කරුණු ඇතුළත්ව ලියා ඇති පිළිතුරට ලකුණු 07 යි)

03.

(i)

(අ) දෝමනස්ස සහගත පටිඝ සම්පයුක්ත අසංඛාරික සිත

දෝමනස්ස සහගත පටිඝ සම්පයුක්ත සසංඛාරික සිත

(සිත් දෙක නිවැරදිව ලියා ඇත්නම් පමණක් ලකුණු 02 යි)

(ආ)

- අප්‍රිය අරමුණු ඇතිවීම, හමුවීම සහ අරමුණට විරුද්ධ ස්වභාවය ය.
- පටිඝය සිතට මතුවීම හෙවත් දෝෂ චෛතසිකය ක්‍රියාත්මක වීම.
- නිතර කිපෙන සුළු බව හා තරහ ගති ඇතිබව.
- අරමුණු ගැන දුරදිග කල්පනා නොකිරීම හෙවත් අයෝනිසෝ මනසිකාරය.
- ධර්මය පිළිබඳ අවබෝධයක් නැතිකම හෙවත් නූගත්කම. (අයෝනිසෝමනසිකාරය)

(මේවායින් කවර හෝ ලක්ෂණ තුනක් නිවැරදිව දක්වීමට ලකුණු 03 යි)

(ii) ලෝභ, දෝෂ, මෝහ යන අකුසල මූල්තුන හෙවත් චෛතසික එකක් හෝ දෙකක් එකතුවීමෙන් මේ අකුසල සිත් ඇතිවේ. එහි ප්‍රවෘත්ති විපාක වශයෙන් අනිටු විපාක පුද්ගලයාට ලැබේ.

- **ලෝභය යනු :** තම සිතට හොඳය, රුචිය, ආශාවය, රාගය, ආදරය ඇති කරන අරමුණු නිසා ඒවා ලබාගැනීමේ චේතනාව සමග ඇතිවන ස්වභාවයයි. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම නිසා ලෝභ මූල අකුසල සිදුවේ.
- **දෝෂය යනු :** සිතෙන් ගන්නා අරමුණු කෙරේ ඇතිවන විරුද්ධ ස්වභාවය නිසා නොකැමැති බව, අරුචිය, අනාදරය නිසා කෝපය, වෛරය, නොසතුට ඇතිවීම හේතුවෙන් එම අරමුණු සමග ගැටීම, ඒවාට පහරදීම උදෙසා ඇතිවන චේතනාව සහ එය ක්‍රියාත්මක කිරීම.
- **මෝහය යනු :** යම් යම් අරමුණු යථා පරිදි අවබෝධ කරගැනීමට නොහැකි බව හෙවත් නොදැනීම සහ අයෝනිසෝමනසිකාරය හේතුවෙන් මෝහය මතුවේ. මේ මෝහය අකුසල සිත් සියල්ලේම යෙදේ.

(මේ කරුණු ඇතුළත් පිළිතුරට ලකුණු 06 යි)

(iii) **දෝෂ මූලිකව කටයුතු කිරීම නිසා**

- පුද්ගලයන් සමග ගැටුම් ඇතිවේ - සමාජයට බිය ගෙන දේ.
- නිවැරදි තීරණ ගැනීමට නොහැකි වේ - කුසල් අකුසල් වෙන්කරගත නොහැකිය.
- ශාරීරිකව පිරිහේ - එයම ලෙඩ රෝගවලට හේතු වේ.
- මානසිකව වික්ෂිප්ත වේ - කරන කියන දේ තමාටම නොතේරේ.
- සමාජයේ පිළිකුලට හා දෝෂ දර්ශනයට ලක්වේ.
- අකුසල් රැස් වේ - කුසලයට යොමු නොවේ.
- මරණින් මතු සතර අපාගතව දුක් විඳී.

(මේ කරුණු ඇතුළත්ව දෙලොව පිරිහීම පැහැදිලි කර ඇත්නම් ලකුණු 07 යි)

4.

(i)

(අ) කරුණා, මුදිතා

(ලකුණු 01 යි)

අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කරගෙන පවතින බැවින් මේ චෛතසික දෙක අප්පමඤ්ඤා ලෙස නම් කෙරේ.

(ලකුණු 01 යි)

(ආ)

- මෙත්තා = අදෝෂ - ශෝභන සාධාරණ 6 වැනි චෛතසිකය
- කරුණා = කරුණා
- මුදිතා = මුදිතා

  } අප්පමඤ්ඤා චෛතසික වශයෙන් හා ශෝභන අසාධාරණ චෛතසික වශයෙන් 23 හා 24 චෛතසික

- උපේක්ඛා = තත්‍රමජ්ඣත්තතාව - ශෝභන සාධාරණ 7 වැනි චෛතසිකය

(ලකුණු 03 යි)

(ii) **හිරි - පාපය පිළිකුල් කිරීම හෙවත් පාපයට හැකිලෙන ගතිය.**

- පාපයට ලජ්ජා වේ.
- මෙහි විරුද්ධාර්ථය අහිරිතය යි. සියලු අකුසල් සිත්වල යෙදේ.
- හිරිය සියලුම කුසල් සිත්වල යෙදේ.
- අත්තාධිපත්‍ය වශයෙන් සිතීම. තමාගේ අධ්‍යාත්මය සමග ගළපා බැලීම.
- තමාගේ කුල ගෝත්‍ර, උගත්කම, දෙමව්පියෝ සමාජ තත්ත්වය සලකා අකුසලයට පිළිකුල් කිරීම.

(මේ කරුණු ඇතුළත්ව ලියා ඇති පිළිතුරට ලකුණු 03 යි)

ඔත්තප්ප - කාය වාග් දුශ්චරියට බියවීම හෙවත් පාපයෙන් තැතිගැනීම.

- පාපයට බියවීම.
- මෙහි විරුද්ධාර්ථය අනොත්තප්පයයි සියලුම අකුසල් සිත්වල යෙදේ.
- ඔත්තප්පය සියලු කුසල් සිත්වල යෙදේ.
- ලෝකාධිපත්‍යෝ වශයෙන් සිතීම, සමාජය සමඟ ගළපා බැලීම.
- කාය වාග් දුශ්චරිත කිරීමෙන් අනුන්ගෙන් හිරිහැර වීම.
- නීතියෙන් දඩුවම් ලැබීම.
- සමාජයේ පිළිකුලට හා ගැරහීමට ලක්වීම.
- සතර අපා දුකට පත්වීම.
- තම ගෞරවය රැක ගැනීමේ කැමැත්ත නිසා අකුසලයට බියවීම.

(මේ කරුණු ඇතුළත්ව ලියා ඇති පිළිතුරට ලකුණු 03 යි)

(iii) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යනු සතර බ්‍රහ්ම විහරණයයි. පුද්ගලයාගේ සහ සමාජයේ යහපැවැත්මට මේවා බලපෑම් කරන්නේ කෙසේද, අනුකූල වන්නේ කෙසේ ද යන්න විමසිමේ දී

- මෙත්තාව අන් අය සමඟ මිතුරු බවක් ගොඩනැගේ. අන් අය දෙස මෙත් සිතින් බලයි.
- මෛත්‍රිය වඩන්නාට - ආනිසංස එකොළහක් (11) ලැබේ.
- කරුණාව - තමාට දුක් ඇතිවනවාට අකමැති සේම අන්‍යයන්ට ද දුක් ඇතිවීම නොඉවසීම. අනුන් දුකින් මුදවනු කැමැතිම. මේ යහපත් සිතුවිල්ල තමාටත් සමාජයේ ඇසුරු කරන්නන්ටත් අන්‍යෝන්‍ය වශයෙන් රැකවරණයක් සැලසේ, උපකාරයක්ම වේ.
- මුදිතාව - තමාට යම් සම්පතක් ලැබුණු පසු සතුටු වන්නන් මෙන්ම අන්‍යයන්ටත් ලැබුණු සම්පත් දැකීමෙන් සතුටුවීම උසස් මානව ගුණයකි. මෙයද තමාගේ සිත සිහිල් කරන අතර අන්‍යයන්ගේ සිත ද පහන් කරන්නකි.
- උපේක්ෂාව යනු - මැදහත් සිතින් ඉවසා සිටීමයි. අන්‍යයන්ගේ චෝදනා ගැරහුම් ඉවසා සිටීම ඒ අනුව අරාවුල්වලට, ගැටුම්වලට මැදිහත් නොවීම නිසාම සිත සන්සුන් වේ. අන්‍යයන්ගේ සිත්වල ද සතුරන් තුළ පවා අනුකම්පාවක් ඇතිකළ හැකිය.

(මේ කරුණු ඇතුළත් පිළිතුරට ලකුණු 07 යි)

05.

(i)

(අ) කම්ම, චිත්ත, ඍතු, ආහාර

(ලකුණු 02 යි)

(ආ)

- කබලිංකාහාර, ඵස්ස ආහාර, මනෝසංචේතනා ආහාර, විඤ්ඤාණ ආහාර.

(ලකුණු 03 යි)

(ii) පඨවි, ආපෝ, තෙජෝ, වායෝ

(ලකුණු 03 යි)

ආපෝ :-

- පඨවි ධාතුවට විසිර යා නොදී ඒකරාශි කිරීම.
- වැගිරෙන බව, ඇලෙන බව, ගලන බව ලක්ෂණ වේ.
- ඕනෑම රූපයක ආපෝ ධාතුව ඇතුළත හා පිටත පැතිර පවතී.
- මනුෂ්‍ය ශරීරයේ ආපෝ කොටස් 12 ක් පවතී.

(මේ කරුණු ඇතුළත් හැදින්වීමට ලකුණු 03 යි)

තේජෝ :-

- උණුසුම් බව සිහිල් බව තේජෝ ධාතුවයි.
- අනෙක් ධාතූන් තුන පාලනය කරන්නේය.
- සෑම රූප කලාපයකම තේජෝ ධාතුව ඇත.
- අලුත් රූප කලාප ඇතිකරයි.
- රූප කලාප විශාල කිරීම හා ශක්තිමත් කිරීම.
- වැඩිහිටිවීම, මහලුවීම, මරණය සිදුවන්නේ ද තේජෝ ධාතුව මගින් පාලනය කිරීම නිසාය.
- මිනිස් ශරීරයේ සතර වැදෑරුම් තේජෝ ධාතුවක් පවතී.

(මේ කරුණු ඇතුළත් හැදින්වීමට ලකුණු 02 යි)

(iii) සංඛත ධර්ම යනු හේතු ප්‍රත්‍ය සමවායයෙන් හටගත් සියල්ල යි. මෙයම සංඛාර යනුවෙන් ද හැදින්වේ.

(ලකුණු 02 යි)

සංඛතයන්ට ආවේණික වූ අදාළ වූ ලක්ෂණ තුනක් පවත්නා බව "තීණිමානි භික්ඛවේ සංඛතස්ස සංඛත ලක්ඛණානි, කතමානි තීණි"

1. උප්පාදෝ පඤ්ඤායති
2. වයෝ පඤ්ඤායති
3. ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති.

උප්පාද යනු ඇතිවීම - හෙවත් හට ගැනීම. වයෝ හෙවත් වැයවීම හෙවත් මරණය. ඨිතස්ස අඤ්ඤතත්තං යනු උපත හා මරණය අතර කාලය වෙනස් වෙමින් පැවතීම හෙවත් විපරිනාම ධර්තාව එමගින් අර්ථවත් වේ.

(මේ කරුණු ඇතුළත් පැහැදිලි කිරීමට ලකුණු 05 යි)

06.

(i)

(අ) පඤ්චද්වාරික විථි, මනෝද්වාරික විථි

(ලකුණු 02 යි)

(ආ) අභිනව භවයක උපත ලැබූ පසු එම චිත්ත සන්තතිය නොසිඳී පැවැත්මට උපකාරවන්නා වූ සිත හෙවත් ප්‍රතිසන්ධි සිත නිරුද්ධ වූ පසු ඇතිවන එවැනිම සිත බාහිරාලම්භන නැතිවිට ප්‍රතිසන්ධි චිත්තය විසින් ගත් අරමුනෙහිම එල්බ පවත්නා චිත්ත පරම්පරාවයි. මූල චිත්තය ලෙස ද ප්‍රභාශ්වර චිත්තය ලෙස ද මෙය හැඳින්වේ.

(මේ කරුණු ඇතුළත් හැඳින්වීමට ලකුණු 03 යි)

(ii) සම්පටිච්ඡනය : මේ සම්පටිච්ඡ චිත්තය විසින් කරනු ලබන්නේ කිසියම් ද්වාරයකින් හටගත් විඤ්ඤාණයකින් ගත් අරමුණු පිළිගැනීමයි. මේ සිත හටගන්නේ චක්ඛු ප්‍රසාද වස්තුවේ නොව හෘදය වස්තුව ඇසුරු කොටගෙනය. අරමුණු ඉෂ්ට එකක් වී නම් සම්පටිච්ඡන සිත වශයෙන් අහේතුක කුසල විපාක සම්පටිච්ඡන සිත ද, අරමුණු අනිෂ්ට එකක් වී නම් අහේතුක අකුසල විපාක සම්පටිච්ඡන සිත ද එක්වරක් ඉපිද නිරුද්ධ වේ.

(මේ කරුණු ඇතුළත් පිළිතුරට ලකුණු 02 යි)

සන්තීරණ : සම්පටිච්ඡන සිතින් පිළිගත් අරමුණු තවදුරටත් විමසා බැලීම සිදුකරන්නේ සන්තීරණ සිතිනි. හෙවත් තීරණය කරනු ලබන්නේ මේ සිතිනි. අනිෂ්ට අරමුණක් වී නම් අහේතුක උපේක්ඛා සහගත අකුසල විපාක සන්තීරණ සිතට අරමුණ මධ්‍යස්ථ හා ඉෂ්ට එකක් වී නම් අහේතුක උපේක්ඛා සහගත කුසල විපාක සන්තීරණ සිත ද අරමුණ අති ඉෂ්ට එකක් වී නම් අහේතුක සෝමනස්ස සහගත කුසල විපාක සන්තීරණ සිත ද එක්වරක් ඉපිද නිරුද්ධ වේ.

(මේ කරුණු ඇතුළත් පිළිතුරට ලකුණු 02 යි)

වොත්ථපන : සන්තීරණ සිත ඉපිද නිරුද්ධ වූ පසුව අහේතුක ක්‍රියා සිතක් වූ මනෝද්වාර වජ්ජන චිත්තය වොත්ථපන කාර්ය කරමින් ඉපිද නිරුද්ධ වේ. එයින් කෙරෙන්නේ තීරණය කළ අරමුණු නිශ්චය කිරීමයි. මේ වොත්ථපන සිත කිසිවිටක සන්තීරණ සිත තීරණය කළ ආකාරයට වෙනස්ව තීරණය නොකරයි.

(මේ කරුණු ඇතුළත් පිළිතුරට ලකුණු 02 යි)

(iii)

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17
ති	න	ද	ප	ච	සං	ණ	ඛො	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත
ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo	ooo

(ලකුණු 05 යි)

- භවංග සිත එක් චිත්තක්ෂණයකින් පසුව සෙළවීම සහ භවංග සිත නිරුද්ධවීම.
- තදා රම්මන අවස්ථා දෙකක් චිත්තවීථිය අවසානයේ පැවැතීම.

(ලකුණු 02 යි)

07.

(i)

(අ) මෝහ අහිරික අනොත්තප්ප උද්ධච්චය (මෝහ චතුෂ්කය)

(ලකුණු 02 යි)

(ආ) අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡා දිට්ඨි

(ලකුණු 03 යි)

(ii) **රූපාවචර සිත් සංඛ්‍යාව 15 කි**

- රූපාවචර සිත් ධ්‍යාන සිත් ලෙස ද හැඳින්වේ.
- කාමාවචර සිත්වලට වඩා උසස්ය, බලවත් ය.
- කුසල, විපාක, ක්‍රියා වශයෙන් කොටස් තුනකි.
- අරමුණ ඉතා හොඳින් හා ප්‍රබලව ලබා ගැනීමට හැකිය.
- ප්‍රථම ද්විතිය, තෘතිය, චතුර්ථ, පංචම වශයෙන් ධ්‍යාන සිත් පහකි.
- ඒකග්ගතා චෛතසිකය ප්‍රබලම චෛතසිකය ලෙස යෙදේ.
- විතර්ක විචාර ප්‍රීතිය, සුඛ, උපේක්ෂාව උපකාරක ධර්ම වේ.
- පස්වැනි ධ්‍යානය උපදවාගත් තැනැත්තාට අභිඥා ඉපදවිය හැකිය.
- ප්‍රතිසන්ධි විපාක වශයෙන් රූපාවචර බ්‍රහ්ම ලෝකයන් හි උපත ලබයි.
- රූපාවචර බ්‍රහ්ම ලෝකයේ ප්‍රතිසන්ධිය ලැබූ අයට ප්‍රවෘත්ති විපාකද එම කුසල විපාක ලෙස ලැබේ.

(මේ කරුණු ඇසුරෙන් ලියා ඇති හැඳින්වීමට ලකුණු 06 යි)

(iii) ආයුක්ඛය, කම්මක්ඛය, උභයක්ඛය, උපච්ඡේදක

(ලකුණු 02 යි)

- මරණානුස්සති භාවනාව යනු මරණය පිළිබඳ සිහි කිරීමයි. මෙය දස අනුස්සති භාවනාවට ඇතුළත් වෙයි.
- ඒ නිසා සමථ භාවනා අරමුණක් වේ.
- තමන් සහ ලොව වෙසෙන සෑමදෙනා මැරෙන බව ඒකාන්තයි.
- මරණයේ නියත බව මෙනෙහි කිරීම.
- රජවරු, බුදුවරු, රහතුන්, උසස් පුද්ගලයන්, දක්ෂයන්, යෝධයන් ආදි සියලු දෙනාම මැරෙන බව.
- දෙවියන් බඹුන් මැරෙන බව.
- මා වැනි දුබලෙකු කෙසේ ගැලවෙන්ද.
- උපතත් සමග මරණය රැගෙන එයි.
- ගෙවෙන සෑම තප්පරයකම මරණයට ළං වේ.
- ජීවිතය දිය බුබුලකි, පෙන පිඬකි.

(මේ කරුණු අනුව ලියා ඇති හැදින්වීමට ලකුණු 05 යි)

08.

(i)

(අ) නිවන ආවරණය කරනුයේ නීවරණයි හෙවත් නිවන අවුරාලනුයේ නීවරණයි.

(ලකුණු 02 යි)

(ආ) කාමඡන්ද, ව්‍යාපාද, ථීන - මිද්ධ, උද්ධච්ච - කුක්කුච්ඡ, විචිකිච්ඡා

(ලකුණු 03 යි)

(ii) **ව්‍යාපාදය :**

- නීවරණ ධර්මයකි.
- මනසින් කෙරෙන කර්ම පථයකි.
- දෝෂ චෛතසිකය මුල් වීමෙන් ක්‍රියාත්මක වෙයි.
- අනුන් නැසේවා යන හැඟීම.
- නව වැදැරුම් වූ අස්ථාන අඝාතය.
- සැඩ පරුෂ භාවය.
- මෙත් සිත වැඩීමෙන් තදංග වශයෙන් ද.
- ධ්‍යාන සිත් ඉපදවීමෙන් විශ්කම්භන වශයෙන් ද ව්‍යාපාදය දුරු කිරීම.
- අනාගාමී වනතුරු සමුච්ඡේද වශයෙන් ප්‍රහීණය නොවන බවද.

(යන කරුණු ඇසුරෙන් විස්තර කිරීමට ලකුණු 03 යි)

ථීන - මිද්ධ

- අකුසල චෛතසික දෙකකි.
- මේ පාප සිතුවිල්ල ධ්‍යාන හා මාර්ග සිත් වලක්වාලයි.
- සසංකාරික අකුසල සිත්වල යෙදේ.
- විඤ්ඤාණස්කන්ධයාගේ අලස බව ඇති කිරීම ථීන නම් වේ.
- චෛතසිකයන්ගේ අලස බව ඇති කිරීම මිද්ධ නම් වේ.
- ප්‍රඥාව දුර්වල කරයි. සිත කුසලයෙන් වළකා සිටී.

(යන කරුණු ඇසුරෙන් විස්තර කිරීමට ලකුණු 03 යි)

(iii) **සමථ භාවනාව**

- භාවනාවේ මූලික ප්‍රභේද දෙකකි. සමථ හා විදර්ශනා නම් වේ.
- සමාධි භාවනාව නමින් ද හැඳින්වේ.
- සම සතළිස් කර්මස්ථාන අරමුණු ලෙස ගෙන සිත ඒකග්ගතාවට, සමාධියට, ධ්‍යානයට පත් කෙරේ.
- සමේතීති සමථෝ යනුවෙන් නිර්වචන කෙරේ.
- චරිතයන්ට ගැළපෙන ලෙස කර්මස්ථාන හෙවත් අරමුණු ලබාගත යුතුයි.
- ප්‍රතිපක්ෂ ධර්මවලින් නොසෙල්විය හැකි බව හෙවත් නීවරණ වලින් නොසෙල්විය හැකි බව.

(ලකුණු 03 යි)

ලැබෙන ප්‍රතිඵල :

- කුසල අරමුණක බොහෝ වේලා සිත පවත්වාගත හැකිවීම.
- සිත සමාධිගත වීම.
- නීවරණ විශ්කම්භන වශයෙන් යටපත් කිරීම.
- ධ්‍යාන උපදවාගත හැකිවීම.
- අභිඥ උපදවාගත හැකිවීම.
- යෝනිසෝ මනසිකාරය දියුණු වීම.

(යන කරුණු ඇසුරෙන් ප්‍රතිඵල දැක්වීමට ලකුණු 04 යි)

09.

(i)

(අ) ඕරම්භාගීය සංයෝජන, උද්ධම්භාගීය සංයෝජන

(ලකුණු 02 යි)

(ආ) සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස

(ලකුණු 03 යි)

(ii) **මානය :**

- උද්ධම්භාගීය සංයෝජනයකි.
- අරහත් මාර්ග ඥානයෙන් ම සමුච්ඡේද වශයෙන් ප්‍රහීණය කෙරේ.
- සෙය්‍යමාන සදිසමාන, හීනමාන ලෙස තෙවැදෑරුම් බව.
- අත්තුක්කංසන, පරවම්භන සිතුවිලි ඇතිකර ගැනීම.
- මානය තිරිසන් ප්‍රතිසන්ධියකට හේතුවන බව.
- තමා විසින්ම තමාගේ තත්ත්වය වැරදි ලෙස මැන ගැනීම.
- අකුසල චෛතසිකයක් වේ.
- අනුසය, සංයෝජන, කිලේසයන් ලෙස ද දැක්වේ.

(මේ කරුණු ඇසුරෙන් කළ හැදින්වීමට ලකුණු 03 යි)

උද්ධච්චය :

- අකුසල චෛතසිකයකි. සියලුම අකුසල සිත්වල යෙද්.
- නීවරණ ධර්මයන් ද වේ. එය කුක්කුච්චය සමග එකට යෙදේ.
- සිතේ සැලෙන ස්වභාවය හෙවත් ඒකග්ගතාවට ප්‍රතිවිරුද්ධය.
- අරමුණක මැනවින් පිහිටා නොසිටීම හේතු වේ.
- රහත් මග නුවණින්ම ප්‍රහාණය කළ යුතුය.
- නීවරණයක්, සංයෝජනයක් හා කිලේයයක් ලෙස ද දැක්වේ.

(මේ කරුණු ඇසුරෙන් කළ හැදින්වීමට ලකුණු 03 යි)

(iii) කෙලෙස් නිසා වන පලිබෝධ නැති නිසා සුඤ්ඤත නම් වේ. රාගාදි කෙලෙස් ඇති කල්හි නොයෙක් පවිකම් සිදු වේ. එවිට අපාගත වේ. අපාගතවීමේ පලිබෝධය කෙලෙස් ප්‍රහීණය කිරීමේ පලිබෝධ ඇත්තේ ය. කෙලෙස් සියල්ල නැති කිරීමෙන් හෙවත් නිරෝධයෙන් ලබන නිවන - සුඤ්ඤත නම් වේ.

මෙය හොඳය, මෙය නරකය ආදී වශයෙන් සංස්කාරයන් කෙරෙහි වෙන්කර හඳුනාගැනීම, විශේෂ කොට ගැනීම නිමිත්ත ලෙස හැදින්වේ. ඒ සංස්කාර නිසා රාගාදි කෙලෙසුන්ට ජරා මරණාදියට හේතු වේ. අනේක දුක්ඛයන්ට හේතු වේ. දුක යයි යමක් ලොව පවතීද ඒ සියල්ල නිමිති නිසා, නිමිති ගැනීම නිසාම සිදු වේ. එසේ වෙන්කර ගැනීමට යමක් නිවනේ නැත. එබැවින් නිවන අනිමිත්ත වේ. අසංඛත ධර්මයන් නිසාම සංඛාර ධර්මයන්ට අදාළ ආවේණික ලක්ෂණ වලින් යුක්ත නොවේ.

පණිහිත.යතු ආසාවට නමකි. කැමති දේ ලැබුවද ඒවා නැවත නැවත නැතිවන නිසා නැවත නැවත ලබා ගැනීමට ආශාව ඇති වේ හෙවත් පණිහිත වේ. එය මුලාවකි විපල්ලාසයකි. දුකට හේතු වේ. නිවන නැවත නැවත ලැබිය යුක්තක් නොවේ. එහි ආශාවන් නැත. එබැවින් අප්පණිහිත නම් වේ.

(මේ කරුණු ඇසුරෙන් කළ හැදින්වීමට ලකුණු 07 යි)

****



ශ්‍රී ලංකා
විභාග දෙපාර්තමේන්තුව



ලකුණු දීමේ පටිපාටිය

බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

(03) අභිධර්මය.

පරීක්ෂකවරයාගේ නම

සංකේත අංකය : .....

ඇගයීම (ආයතනික විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

S 3

(03) අභිධර්මය

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද **II** කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. **I** කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, **II** කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

විභාග අංකය : ...
T. D. Vidanapathirana
Commissioner of Examinations
(Confidential Branch, Adm.)
For Commissioner General of Examinations

I කොටස

1. (i) ත්‍රිපිටකය තුළ නිප්පරියාය දේසනා හා සප්පරියාය දේසනා අන්තර්ගත වන මිටක දෙක පිළිවෙළින් නම් කරන්න.

(අ) .....

....

(ලකුණු 02 යි)

(ii) ථෙරීය විභජ්ජවාදී අභිධර්ම සම්ප්‍රදායයට අයත් සප්තප්‍රකරණයෙන් **හතරක්** නම් කරන්න.

(iii) දෝෂමූලික අකුසල් සිත්වල 'පටිඝය' ඇතිවීමට හේතු වන කරුණු **තුනක්** දක්වන්න.

.....

(ලකුණු 03 යි)

(iv) ශීල ශික්ෂාවට අයත් මාර්ගාංග නම් කරන්න.

.....

.....

(ලකුණු 03 යි)

(v) සෝවාන් මාර්ග ඥානයෙන් ක්ෂය වන සංයෝජන නම් කරන්න.

(ලකුණු 03 යි)

[දෙවැනි පිටුව බලන්න.

(vi) අනාගාමී ඵලය උපදවා ගත් උතුමන්ට අදාළ **විශේෂ ලක්ෂණ** තුනක් පෙන්වා දෙන්න.

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ලකුණු 03 යි)

(vii) ඉස්සා - මච්ඡරිය යන අකුසල චෛතසික දෙකේ වෙනස පෙන්වා දෙන්න.

.....

.....

.....

.....

.....

(ලකුණු 03 යි)

(viii) බ්‍රහ්ම විහාර භාවනාව හඳුන්වන්න.

.....

.....

.....

(ලකුණු 03 යි)

(ix) යෝනිසෝමනසිකාරය හඳුන්වා, එයින් ලැබෙන ප්‍රයෝජන දෙකක් දක්වන්න.

(අ) හැඳින්වීම : .....

.....

.....

.....

(ආ) ප්‍රයෝජන : .....

.....

.....

.....

(ලකුණු 03 යි)

(x) 'උපාදාන පච්චයා භවෝ' යන්න පැහැදිලි කරන්න.

.....

.....

.....

.....

.....

(ලකුණු 03 යි)

* *

මෙතැනින් පහළ කපන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

S 3

(03) අභිධර්මය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) (අ) අභිධර්මයට අදාළ නිදාන දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) 'සුත්තන්න පරියාය' යන්න පහදන්න. *(ලකුණු 03 යි)*

(ii) ථෙරීය විභජ්ජවාදී අභිධර්ම සම්ප්‍රදාය පිළිබඳව හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ධම්මසංගණිප්පකරණය පිළිබඳව එහි ඇතුළත් මූලික කරුණු පදනම් කර ගනිමින් විස්තරයක් කරන්න. *(ලකුණු 07 යි)*

3. (i) (අ) "සබ්බෙ ධම්මා අනත්තාති" යන ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. *(ලකුණු 03 යි)*

(ii) එම ගාථාවේ දැක්වෙන 'ධම්මා' යන පදය හා සතර පරමාර්ථ ධර්ම අතර ඇති සම්බන්ධය පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) සම්මුති සත්‍යය හා පරමාර්ථ සත්‍යය අතර වෙනස උදාහරණ සහිතව පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

4. (i) (අ) අකුසල මූල නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) අකුසල් සිත්වල දිට්ඨි සම්පයුත්ත බව ඇතිවීමට බලපාන සාධක කුනක් පෙන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(ii) පළමුවැනි හා දෙවැනි ලෝභ මූල අකුසල් සිත් දෙක නම් කොට, එම සිත් දෙකෙහි වෙනස සනිදර්ශනව පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) පුද්ගල සන්තානයේ පරිහානියට අකුසල මූල හේතු වන අයුරු පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

5. (i) (අ) අඤ්ඤසමාන චෛතසිකවල මූලික ප්‍රභේද දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) ඉන් එක් ප්‍රභේදයක් පිළිබඳව පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි)*

(ii) අප්පමඤ්ඤා චෛතසික නම් කර, එම චෛතසික පිළිබඳව හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) සද්ධා චෛතසිකය හඳුන්වා, එම චෛතසිකය පෙරටුවීමෙන් පුද්ගලයා බොහෝ කුසලයන්ට නැඹුරු වන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

6. (i) (අ) පංචස්කන්ධය පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එම ස්කන්ධ විත්ත, චෛතසික, රූප යන පරමාර්ථ ධර්මවලට බෙදා දක්වන්න. *(ලකුණු 03 යි)*

(ii) "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා." යන පාඨයේ සරල අදහස දක්වා, පංචස්කන්ධයේ සිවුවැන්න පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) චතුර්විධ විපල්ලාස නම් කර, ඒවා පුද්ගලයාට යථාර්ථය දැකීමට බාධා කරන අයුරු සනිදර්ශනව පහදන්න. *(ලකුණු 07 යි)*

[හෙරවැඟි පිටුව බලන්න.

Past Papers Wiki

7. (i) (අ) භවාංග චිත්තයේ කාර්යය පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එක් චිත්තක්ෂණයක් තුළ ක්‍රියාත්මක වන අවස්ථා තුන නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) චිත්තවීථි සටහනක දැක්වෙන පංචද්වාරාවර්ජන, සොතවිඤ්ඤාණ හා සම්පටිච්ඡන යන චිත්ත ක්ෂණයන්ගෙන් කෙරෙන කාර්ය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ශ්‍රෝතද්වාරික අතිමහන්තාරම්මණ චිත්තවීථි සටහන ඇඳ, අතිමහන්තාරම්මණ හා මහන්තාරම්මණ චිත්තවීථි අතර මූලික වෙනස පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

8. (i) (අ) කර්මයේ විපාක මූලික ප්‍රභේද දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) මනසින් කෙරෙන අකුසල කර්මපථ නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) කර්මයෙන් කෙරෙන කෘත්‍ය සකර සිළිවෙළින් නම් කර, එහි පළමුවැන්න හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) "මිනිසාට මුහුණ දීමට සිදුවන්නේ 'කම්ම නියාමයට' පමණක් නොවේ." සනිදර්ශනව නහවුරු කරන්න. *(ලකුණු 07 යි)*

9. (i) (අ) "යථා සීලං තථා පඤ්ඤා - යථා පඤ්ඤා තථා සීලං" යන පාඨයේ සරල අදහස ලියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) විරති සීලය හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(ii) සීලයෙන් කායික වාචසික සංවරය ඇති කෙරෙන ආකාරය පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) "ප්‍රඥාව වැඩිය හැකි එකම මාර්ගය වන්නේ සීලයෙන් ඉන්ද්‍රිය සංවර කර ගැනීම හා භාවනාවෙන් සමාධිය උපදවා ගැනීමයි." ප්‍රමාණවත් කරුණු සහිතව සනාථ කරන්න. *(ලකුණු 07 යි)*

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library